මුදල් ප්‍රතිපත්ති වාර්තාව

2026 පෙබරවාරි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මුදල් ප්‍රතිපත්ති වාර්තාව වසරකට දෙවරක් පළ කෙරෙනු ලබන ප්‍රකාශනයකි. මෙම වාර්තාවේ අන්තර්ගතය, 2026 වසරේ ජනවාරි මස 28 වැනි දින සිදු කළ මුදල් ප්‍රතිපත්ති නිවේදනය සමඟ නිමාවට පත් වුණු ශ්‍රී ලංකා මහ බැංකුවේ 2026 වසරේ ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති තීරණ වාරය වනවිට පැවති දත්ත මත මූලික වශයෙන් පදනම් වේ.

© ශ්‍රී ලංකා මහ බැංකුව

ISBN 978-624-6764-21-0

2026 පෙබරවාරි 13

පටුන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව 4

සාරාංශය 6

1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය 8

2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම 10

2.1. මූලික පුරෝකථන 10

උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම 10

මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම 14

2.2. පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන 15

ගෝලීය පරිසරය 15

රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මග 16

විදේශීය ජංගම ගිණුම 16

2.3. වාර්තා වන සැබෑ දත්ත මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම් 16

වාර්තා වන සැබෑ උද්ධමනය මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම් 16

වාර්තා වන සැබෑ ආර්ථික වර්ධනය මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම් 17

2.4. පෙර පුරෝකථන සමඟ සැසඳීම 18

මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කළ ප්‍රධාන උපකල්පන 18

උද්ධමනයේ හැසිරීම 20

3. වර්තමාන ආර්ථික තත්ත්වය 21

3.1. උද්ධමනය 21

විශේෂ සටහන (අ): ශ්‍රී ලංකාවේ මෑත කාලීන අවධමන තත්ත්වය පිළිබඳව ගැඹුරින් විමසා බැලීම 25

3.2. මූර්ත අංශය 30

3.3. මුදල් අංශය 32

පොලී අනුපාතික 32

දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය 35

දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම 35

3.4. විදේශීය අංශය 38

ගෙවුම් තුලනය 38

විනිමය අනුපාතිකය 41

සංචිත වත්කම් 42

3.5. රාජ්‍ය මූල්‍ය අංශය 43

3.6. මූල්‍ය අංශය 44

3.7. ගෝලීය ප්‍රවණතා 47

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, දේශීය මිල ස්ථායීතාව ළඟා කර ගැනීම හා පවත්වාගෙන යාම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූලික අරමුණයි. උද්ධමනය අඩු සහ ස්ථාවර මට්ටමක පවත්වාගෙන යෑමෙන්, මහ බැංකුව දිගු කාලීන ආර්ථික වෘද්ධිය ප්‍රවර්ධනය කිරීමට දායක වන අතර එමගින් මහජනතාවගේ ආර්ථික හා මූල්‍ය යහපැවැත්ම වෙනුවෙන් දායක වෙයි.

මහ බැංකුව දේශීය මිල ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම සහ පවත්වා ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය[1] මුදල් ප්‍රතිපත්ති සකස් කිරීම හා නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සමඟ සමගාමී වන නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර ඇති කරගත් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම මගින් තීරණය කර ඇති ඉලක්කගත මට්ටමේ උද්ධමනය පවත්වාගෙන යෑම මෙම රාමුවේ අරමුණයි. මෙම ගිවිසුම මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම ලෙස හැඳින්වේ. 2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව කාර්තුමය මතුපිට උද්ධමනය 5%ක අගයක පවත්වාගත යුතුය[2]. මුදල් ප්‍රතිපත්ති ගිවිසුම් රාමුව යටතේ, උද්ධමනයේ ඇතිවිය හැකි අපගමනයන් මැනීමට හා මහ බැංකුවේ වගවීමේ අරමුණු සඳහා ප්‍රතිශතාංක ±2ක ආන්තිකයක් (එනම් 3.0 %– 7.0%) ලබා දී ඇත. අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා උද්ධමනය එම ආන්තික දෙක අතර පවත්වා නොගතහොත් මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය විසින් මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එය මහජනතාවට ද ලබා ගත හැකි විය යුතුය.

උද්ධමන ඉලක්කය ළඟා කරගැනීම සඳහා, මහ බැංකුව කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික ඉලක්කගත මග ඔස්සේ මෙහෙයවීමට සිය මුදල් ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි. වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමුව යටතේ, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති උපකරණය ලෙස පවතින අතර, එය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සන්නිවේදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනෙයි. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය මහ බැංකුවේ මෙහෙයුම් ඉලක්කය ලෙස ක්‍රියාත්මක වෙයි. ඒ අනුව, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ප්‍රකාශයට පත් කළ පසු, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මත හෝ ඒ ආසන්නව පවත්වාගෙන යෑමට මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාවට නංවයි. මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේ දී පවතින සහ අපේක්ෂිත දේශීය වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන් පිළිබඳව මනාව සැලකිල්ලට ගනු ලබයි. ඉන් අනතුරුව, පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව, එක්දින වෙළඳපොළ පොලී අනුපාතිකයෙහි සිදුවන වෙනස්කම් මූල්‍ය වෙළඳපොළ හරහා ආර්ථිකයට සම්ප්‍රේෂණය වන අතර, අවසානයේ එය උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කරයි.

මුදල් ප්‍රතිපත්ති තීරණ ඉදිරි දැක්මක් සහිත වන අතර දත්ත මත පදනම් වේ. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග උද්ධමනය කෙරෙහි බලපෑමක් ඇති කිරීමට කාලයක් ගතවන බැවින්, ඉදිරි දැක්මක් සහිත ප්‍රවේශයක් අත්‍යවශ්‍ය වේ. සුදුසු

---

[1] මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය මහ බැංකු අධිපතිවරයා, මහ බැංකුවේ පාලක මණ්ඩලයේ සාමාජිකයින්, ආර්ථික විද්‍යාව හා මූල්‍ය යන ක්ෂේත්‍රවල විශේෂඥයන් දෙදෙනක් මෙන් ම මිල ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව භාර මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරුන්ගෙන් සමන්විත වේ.

[2] අංක 2352/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් උද්ධමන ඉලක්කය මහජනතාවට සන්නිවේදනය කරන ලදී. කාර්තුමය මතුපිට උද්ධමනය යනු අනුරූප කාර්තුවේ මාස තුන තුළ මාසිකව කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීමේ සරල සාමාන්‍යයයි.

මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වසරකට සය වතාවක් රැස් වේ. මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය, සිය තීරණ ගැනීමේ දී, වත්මන් උද්ධමනය සහ එහි ඉදිරි දැක්ම, ආර්ථික තත්ත්වය සහ අනාගත ආර්ථික අපේක්ෂා මෙන්ම එවැනි පුරෝකථන හා සම්බන්ධ අවදානම් හා අවිනිශ්චිතතා පිළිබඳව ද ඇගැයීමක් සිදු කරයි. මෙම ඇගයීමේ දී පුරෝකථනය කළ මූලික ගෝලීය ප්‍රවණතා සහ අවිනිශ්චිතතා ද සැලකිල්ලට ගනු ලබයි. මෙම රැස්වීම්වල දී සැලකිල්ලට ගනු ලබන පුරෝකථන, පවතින දත්ත, ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ කෙටි කාලීන පුරෝකථන සහ ගෝලීය ආර්ථික දර්ශකවලට අදාළ පුරෝකථන මෙන් ම කාර්ය මණ්ඩල විනිශ්චයන් මත පදනම් වේ. මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතු අභ්‍යන්තර කමිටුවක් වන මුදල් ප්‍රතිපත්ති කමිටුව සවිස්තරාත්මක තාක්ෂණික ඇගයීම් සහ ප්‍රතිපත්ති සාකච්ඡාවලින් අනතුරුව මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සලකා බැලීම සඳහා ප්‍රතිපත්ති නිර්දේශ සපයයි.

නම්‍යශීලී උද්ධමන ඉලක්කරණ රාමුවේ වැදගත් අංගයක් වන මුදල් ප්‍රතිපත්ති වාර්තාව, මහ බැංකු පනතේ 27 සහ 80 වන වගන්ති ප්‍රකාරව සකස් කර ඇත. මෙම වගන්තිවලට අනුව වත්මන් උද්ධමන ප්‍රවණතා, උද්ධමනය සඳහා බලපාන සාධක, මැදි කාලීන උද්ධමන පුරෝකථන, ඒ සඳහා ඇති ප්‍රධාන අවදානම් මෙන් ම මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු ළඟා කරගැනීම පිළිබඳව විස්තර කෙරෙන ද්විවාර්ෂික වාර්තාවක් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වේ. මෙම වාර්තාව ආර්ථිකයේ වර්ධන ඉදිරි දැක්ම පිළිබඳ තක්සේරුවක් සපයන අතර ම, දේශීය ආර්ථිකයේ වත්මන් ප්‍රවණතා මෙන්ම ගෝලීය ආර්ථිකය පිළිබඳව ද මහජනතාවට තොරතුරු සපයයි. මෙම වාර්තාව මහ බැංකුවේ ප්‍රතිපත්තිවල විනිවිදභාවය සහ විශ්වසනීයභාවය පිළිබිඹු කරන සාක්ෂියක් ලෙස කටයුතු කරයි. ඊට අමතරව, මෙම වාර්තාව හරහා දේශීය ආර්ථිකයේ මෙන්ම ගෝලීය ආර්ථිකයේ වත්මන් ආර්ථික තත්ත්වය පිළිබඳව මහජන අවබෝධය වැඩි කිරීමට කටයුතු කරන අතර ම, ආර්ථික වර්ධන ඉදිරි දැක්ම සමඟ ඒ හා සම්බන්ධ අවදානම් පිළිබඳ තක්සේරුවක් සපයයි.

රූප සටහන **01:** **ශ්‍රී ලංකාවේ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය** *(වසරකට සය වතාවක්)*



සාරාංශය

තීරණාත්මක ව්‍යුහමය සහ ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ දී ඇති කර ගත් ප්‍රගතියත් සමඟ 2025 වසරේ දී ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථායීතාව තවදුරටත් ශක්තිමත් විය. මෙම වසර දේශීය සහ ගෝලීය වශයෙන් දැඩි කම්පනවලට මුහුණ දුන් වසරක් ලෙස සනිටුහන් වුවද ආර්ථිකයේ ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කෙරිණි. එමගින් ස්වාරක්ෂක ශක්තිමත් කිරීම සඳහා ගත් තීරණාත්මක පියවරවල ඵලදායී බව සහ ආර්ථිකය ස්ථාවරත්වයට පත් කිරීමේ දී හා ආර්ථික පදනම ශක්තිමත් කිරීමේ දී ලබා ඇති අර්ථවත් ප්‍රගතිය අවධාරණය කෙරේ.

මාස එකොළහක අවධමන කාලසීමාවක අවසානය සනිටුහන් කරමින්, 2025 අගෝස්තු මස දී උද්ධමනය ධන අගයකට පත්විය. ඉන් අනතුරුව, උද්ධමනය ක්‍රමිකව ඉහළ යමින්, 2025 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා අඛණ්ඩව මාස තුනක දී නොවෙනස්ව පැවතුණි. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සැපයුම් දාමයට තාවකාලික බාධා එල්ල වීමත් සමඟ දෙසැම්බර් මාසයේ ආහාර මිල ගණන් ඉහළ යැමේ යම් පීඩනයක් පෙන්නුම් කළ ද, සමස්ත උද්ධමනය ස්ථාවරව පැවතිණි.

උද්ධමනය ක්‍රමයෙන් ඉහළ ගොස් 2026 වසරේ දෙවන භාගයේ දී 5%ක ඉලක්කගත මට්ටමට ළඟා වනු ඇතැයි පුරෝකථනය කෙරේ. ඉල්ලුම් තත්ත්ව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම මෙම ඉහළ යැමේ ප්‍රවණතාවට පුළුල් ලෙස දායක වනු ඇති අතර, අපේක්ෂිත පරිදි අඩු බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය සාමාන්‍යකරණය වීම සහ සාපේක්ෂව ඉහළ ගිය ආහාර උද්ධමනය ද මෙම ඉහළ යැමට සහාය වනු ඇත. සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, මැදි කාලීනව උද්ධමනය 5%ක ඉලක්කගත මට්ටමට ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මූලික උද්ධමනය ද මතුපිට උද්ධමනයෙහි ඉලක්කයට අනුකූල මට්ටමක ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමන ඉදිරි දැක්ම සම්බන්ධයෙන් ඉහළ සහ පහළ යැමේ අවදානම් දෙකම පවතින අතර, සමස්ත අවදානම නුදුරු හා මැදි කාලීනව බොහෝ දුරට මධ්‍යස්ථව පවතින බවට තක්සේරු කෙරේ.

ආර්ථිකයේ පැවති අඩු උද්ධමන තත්ත්වය සහ උද්ධමනය අඩු මට්ටමක රැඳෙනු ඇතැයි පවතින ඉදිරි දැක්ම මධ්‍යයේ මහ බැංකුව සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන ගියේය. 2025 වසරේ අග භාගය වන විට කෙටි කාලීන මුදල් වෙළඳපොළ පොලී අනුපාතිකවල යම් වැඩි වීමක් සිදු වුව ද, වැඩි දියුණු වූ ද්‍රවශීලතා තත්ත්ව සහ බැංකු අතර ද්‍රවශීලතාව වඩාත් ඒකාකාරව බෙදී යාම හේතුවෙන් ඉන් අනතුරුව පොලී අනුපාතික පහළ ගියේය. සමස්තයක් ලෙස, 2025 වසරේ දී වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහය පහළ යන ලදී. අඩු පොලී අනුපාතික පවතින වාතාවරණයක් තුළ, වර්ධනය වන ආර්ථික ක්‍රියාකාරකම් සහ වාහන ආනයන ඉහළ යැම පිළිබිඹු කරමින්, පුද්ගලික අංශය වෙත ලබා දුන් ණය වසර පුරා අඛණ්ඩව ප්‍රසාරණය විය.

2025 වසරේ දී විදේශීය අංශයේ කාර්යසාධනය වැඩිදියුණු වූ අතර, ජංගම ගිණුම අඛණ්ඩව තුන්වන වරටත් අතිරික්තයක් වාර්තා කර ඇති බවට ඇස්තමේන්තු කර ඇත. 2025 වසරේ දී ශ්‍රී ලංකා රුපියල ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 5.6%කින් අවප්‍රමාණය වූ අතර, 2026 වසරේ මුල් භාගයේ දී බොහෝ දුරට ස්ථාවරව පැවතුණි. අර්බුදයෙන් පසු සිදු කළ වැඩිම බාහිර ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ වුවද, මහ බැංකුව මගින් සිදු කළ ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් සහ බහුපාර්ශ්වික ආයතනවලින් ලද ලැබීම් හේතුවෙන්, 2025 වසරේ අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය ඉහළ ගියේය.

ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන් 2025 වසරේ මුල් මාස එකොළහ තුළ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය අඛණ්ඩව ශක්තිමත් විය. දිට්වා සුළි කුණාටුවෙන් සිදු වූ හානිවලට ප්‍රතිචාර ලෙස, 2026 වසර සඳහා වන පරිපූරක අයවැය ඇස්තමේන්තුව ඔස්සේ සහාය ලබා ගනිමින් බලපෑමට ලක් වූ යටිතල පහසුකම් යථා තත්ත්වයට පත් කිරීම ඇතුළු සහන ක්‍රියාමාර්ග මාලාවක් රජය විසින් ක්‍රියාත්මක කරන ලදී.

2025 වසරේ මුල් මාස නවය තුළ ආර්ථිකයෙහි ඉහළ වර්ධනයක් වාර්තා විය. 2025 වසරේ අග භාගයේ දී ඇති වූ දිට්වා සුළි කුණාටුව නිසා ඇති වූ බාධා හේතුවෙන් ආර්ථික ක්‍රියාකාරකම් කෙටිකාලීනව මන්දගාමී වුව ද, ආර්ථිකය ඉක්මනින් යථා තත්ත්වයට පත් වීම, ආර්ථිකයෙහි සියලුම අංශ වෙත ධනාත්මක බලපෑමක් ඇති කිරීම, සහ සමස්ත ආර්ථිකයෙහි වර්ධන ප්‍රවණතාව සවිගැන්වීම සඳහා කාලෝචිත ප්‍රතිපත්ති මැදිහත්වීම් මගින් සහාය වනු ඇතැයි අපේක්ෂා කරන අතර එමගින් ඉදිරි කාලීනව කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කෙරෙනු ලැබේ. ප්‍රමුඛ දර්ශක මගින් ද ආර්ථික ක්‍රියාකාරකම්වල අඛණ්ඩ ඔරොත්තුදීමේ හැකියාව පෙන්නුම් කරන අතර, ශක්තිමත් ණය ප්‍රසාරණය සහ දැනට පවත්නා ලිහිල් මුදල් ප්‍රතිපත්තිමය තත්ත්වය මෙම ගම්‍යතාවයට තවදුරටත් සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ඉහළ යන ගෝලීය වෙළඳ අර්බුද සහ භූ දේශපාලනික අවිනිශ්චිතතා හේතුවෙන් ඇති වන බාහිර බලපෑම් සමස්ත ආර්ථික කාර්යසාධනය සහ වර්ධන අපේක්ෂාවන් මත බලපෑමක් ඇති කළ හැකිය.

1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය

ශ්‍රී ලංකා මහ බැංකුව 2025 වසර තුළ දී සහ 2026 වසරේ මේ දක්වා කාලය තුළ දී සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන ගියේ ය. 2025 මැයි මස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 25කින් 7.75% දක්වා අඩු කිරීමෙන් අනතුරුව, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය එම මට්ටමේ ම පවත්වා ගැණුනි. ආර්ථිකයේ සමස්ත ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන පසුබිමක, අඛණ්ඩව පැවති අඩු උද්ධමන වාතාවරණය සහ හිතකර උද්ධමන අපේක්ෂා මෙම ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වා ගැනීමට ප්‍රධාන වශයෙන් සහාය විය.

2025 වසරේ සැප්තැම්බර් මස පැවති පස්වන මුදල් ප්‍රතිපත්ති සමාලෝචනයේ දී, 2025 වසරේ මැයි මස සිදු කළ ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීමෙන් අනතුරුව අඛණ්ඩව දෙවන වරටත් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය දැනට පවත්නා මට්ටමේ ම පවත්වා ගැනීමට මහ බැංකුව තීරණය කළේය. මාස එකොළහක් මුළුල්ලේ අඛණ්ඩව පැවති අවධමනයෙන් පසු, අපේක්ෂා කළ පරිදි, 2025 අගෝස්තු මාසයේ දී උද්ධමනය යළි ධන අගයකට පැමිණීම මෙයට හේතු විය. තව ද, උද්ධමන අපේක්ෂා ඉලක්කය වෙත ගමන් කිරීමත් සමඟ උද්ධමනය ක්‍රමයෙන් ඉලක්කය කරා ගමන් කරනු ඇතැයි පුරෝකථන මගින් පෙන්නුම් කෙරිණි. මේ අතර, වෙළඳපොළ පොලී අනුපාතිකවල අඛණ්ඩ පහළ යෑම, ඉහළ ආර්ථික වර්ධන තත්ත්වය සහ කම්පන සඳහා විදේශීය අංශයේ ඔරොත්තු දීමේ ඉහළ හැකියාව ද මෙම තීරණයට සහාය විය.

ආනයන ඉල්ලුම වැඩි වීමත් සමඟ විනිමය අනුපාතිකයේ අවධමන පීඩන තත්ත්වයක් මධ්‍යයේ, යම් ප්‍රමාදයක් සහිතව වුව ද, උද්ධමනය අපේක්ෂිත පරිදි ඉලක්කය වෙත යොමු වනු ඇතැයි පුරෝකථනය මගින් පෙන්නුම් කිරීමත් සමඟ 2025 වසරේ නොවැම්බර් මාසයේ දී මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වා ගත්තේය. ඊට අමතරව, පෞද්ගලික අංශයේ අඛණ්ඩ ණය ප්‍රසාරණයට සහාය වෙමින් මුදල් තත්ත්වය ද ප්‍රමාණවත් ලෙස ලිහිල්ව පැවති අතර, වර්ධනය වන ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වීමට මෙන්ම, විශේෂයෙන් ම වාහන ආනයනය ඇතුළු ආනයන ඉල්ලුම සපුරාලීම සඳහා වූ ණය වැඩි වශයෙන් යොමු වීම ඉහළ ණය ප්‍රසාරණයට හේතු විය.

පවතින අඩු මට්ටමේ උද්ධමනය සහ 2026 වසරේ දෙවන භාගය වන විට උද්ධමනය අපේක්ෂිත ඉලක්කය කරා යොමුවීම සැලකිල්ලට ගෙන, 2026 වසරේ ජනවාරි මාසයේ පැවති මුදල් ප්‍රතිපත්ති සමාලෝචනයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පවතින මට්ටමේ ම පවත්වාගෙන යෑමට තීරණය කෙරුණි. දිට්වා සුළි කුණාටුවෙහි බලපෑම මධ්‍යයේ දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල දක්නට ලද ඔරොත්තු දීමේ හැකියාව සහ විදේශ අංශයේ ශක්තිමත් කාර්යසාධනය මෙම තීරණයට හේතු විය. මේ අතර, පුද්ගලික අංශයේ ණය අපේක්ෂා කළ මට්ටමට වඩා ප්‍රසාරණය වීම ද මධ්‍යස්ථ ස්ථාවරයක අවශ්‍යතාව තහවුරු කළේ ය. ඉදිරියේ දී, සුදුසු ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම සඳහා දේශීය ආර්ථිකයේ ප්‍රවණතා මෙන්ම ගෝලීය භූ දේශපාලනික සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතතා සම්බන්ධ තත්ත්වයන් ඇතුළු අනෙකුත් කරුණු සමීපව නිරීක්ෂණය කිරීමට මහ බැංකුව කටයුතු කරනු ඇත.

සාරාංශයක් ලෙස, 2023 වසරේ ආරම්භ කෙරුණු වත්මන් මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණ කාලපරිච්ඡේදය තුළ දී මහ බැංකුව සිය ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමස්තයක් ලෙස ආසන්න වශයෙන් පදනම් අංක 800කින් (ප්‍රතිශතාංක 8.0කින්) අඩු කර ඇත.

මෙම වසරේ දෙවන මුදල් ප්‍රතිපත්ති විවරණය සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය 2026 වසරේ මාර්තු මස දී රැස්වෙනු ඇත.

පසුගිය මුදල් ප්‍රතිපත්ති වාර්තාවෙන් පසු මුදල් ප්‍රතිපත්ති තීරණ (අගෝස්තු 2025 – ජනවාරි 2026):

අංක 05
2025

සැප්තැම්බර් 2025

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75% මට්ටමේ පවත්වා ගෙන යන ලදී

අංක 06
2025

නොවැම්බර් 2025

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75% මට්ටමේ පවත්වා ගෙන යන ලදී

අංක 01
2026

ජනවාරි 2026

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 7.75% මට්ටමේ පවත්වා ගෙන යන ලදී

2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම

උද්ධමනය සහ මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ පුරෝකථන කෙරෙහි අවධානය යොමු කරමින්, 2026 වසරේ ජනවාරි මාසයේ දී එළඹුණු මුදල් ප්‍රතිපත්ති තීරණයට සහාය දැක්වීම සඳහා මහ බැංකු කාර්යමණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ මෙම කොටසේ සාරාංශ කර දක්වා ඇත.[3] මෙම පුරෝකථන මගින්, 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, ප්‍රධාන විචලායයන්හි නුදුරු කාලීන පුරෝකථන, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන, සහ උපකල්පන හා කාර්යමණ්ඩල විනිශ්චයන් පිළිබිඹු කෙරෙන අතර, මෙම පුරෝකථන මෙම වාර්තාවෙහි මූලික පුරෝකථන ලෙස සැලකේ.

2.1. මූලික පුරෝකථන

නවතම නුදුරු කාලීන පුරෝකථනයන්ට අනුව, ඉදිරි මාසවල දී උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ක්‍රමයෙන් ශක්තිමත් වන ඉල්ලුම් තත්ත්වවල සහායයෙන් මතුපිට උද්ධමනය අඛණ්ඩව ඉහළ ගොස් 2026 වසරේ දෙවන භාගයේ දී 5%ක ඉලක්කගත මට්ටම කරා ළඟා වනු ඇතැයි මැදි කාලීන පුරෝකථන මගින් පෙන්නුම් කෙරේ. සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ මැදි කාලීනව උද්ධමනය ඉලක්කගත මට්ටමේ ස්ථායී වනු ඇතැයි අපේක්ෂිතය. දිට්වා සුළි කුණාටුව හේතුවෙන් ඇති වූ බාධා පිළිබිඹු කරමින්, 2025 වසරේ සිව්වන කාර්තුව සඳහා මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) වර්ධනය, 2025 වසරේ පළමු කාර්තු තුනට වඩා පහළ යැමක් වාර්තා කර ඇතැයි තත්කාලීන පුරෝකථන මගින් පෙන්නුම් කරයි. ඒ අනුව, 2025 වසරේ මූර්ත ද.දේ.නි. වර්ධනය 4.5%ක් පමණ වනු ඇත. මේ අතර, පෙර වසර දෙකෙහි වාර්තා වූ වර්ධනය අඛණ්ඩව පවත්වා ගනිමින් 2026 වසරේ ආර්ථික වර්ධනය 4% සිට 5% දක්වා පරාසයේ පවතිනු ඇතැයි දැනට පුරෝකථනය කෙරේ. මැදි කාලීනව වර්ධනය මධ්‍යස්ථව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, වෙනස්වන ගෝලීය හූ දේශපාලනික වාතාවරණය සහ ආර්ථිකයේ දැනට ක්‍රියාත්මක වන ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ මගින් ඇතිවිය හැකි ධනාත්මක බලපෑම් හේතුවෙන් මෙම අපේක්ෂා සඳහා සැලකිය යුතු අවිනිශ්චිතතා පවතී.

උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම[4]

අවධමන කාලපරිච්ඡේදයකින් පසුව 2025 වසරේ අගෝස්තු මාසයේ දී උද්ධමනය ධන අගයකට ළඟා වූ අතර, 2025 වසරේ ජූනි මාසයේ දී විදුලි ගාස්තු ඉහළ යැමේ යම් පමණක බලපෑමෙන් බලශක්ති හා ප්‍රවාහන අවධමනය ලිහිල් වීම සහ මූලික උද්ධමනය සුළු වශයෙන් ඉහළ යැම සමඟ උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. ඉදිරි කාලය තුළ දී උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යැම තවදුරටත් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර 2026 වසරේ දෙවන භාගය වන විට ඉලක්කගත මට්ටම කරා ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමනයේ මෙම අපේක්ෂිත ගමන් මග, ඉල්ලුම් තත්ත්ව ක්‍රමයෙන් වර්ධනය වීම සහ දීර්ඝ අවධමනයකින් පසු බලශක්ති හා ප්‍රවාහන උද්ධමනය ධන මට්ටමකට නැවත පැමිණීමේ අපේක්ෂා පිළිබිඹු කරයි. 2026 වසරේ පළමු කාර්තුවේ දී

---

[3] මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් අර්ධ ව්‍යුහාත්මක සාර්ව ආර්ථික ආකෘතියක් වන කාර්තුමය පුරෝකථන ආකෘතිය (Quarterly Projection Model) භාවිත කරනු ලැබේ. සෑම මුදල් ප්‍රතිපත්ති වාරයකදී ම මෙම පුරෝකථන යාවත්කාලීන කරනු ලබන අතර, ඒ සඳහා, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාසික උද්ධමන දත්ත සහ දළ දේශීය නිෂ්පාදිතයේ කාර්තුමය දත්ත ද ඇතුළුව, නමුත් එම දත්තවලට පමණක් සීමා නොවන, නවතම ආර්ථික ප්‍රවණතා පිළිබඳ දත්ත සහ තොරතුරු භාවිත කෙරේ. ආකෘතික යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියෙහි කොටසක් ලෙස, සමස්ත ආර්ථික වාතාවරණයේ මෑතකාලීන ප්‍රවණතා පිළිබිඹු කරමින්, කාර්තුමය පුරෝකථන ආකෘතියෙහි ඇතැම් පරාමිතීන් යාවත්කාලීන කර ඇත.

[4] මතුපිට උද්ධමනය කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) මත පදනම්ව මනිනු ලැබේ.

විදුලි ගාස්තු සංශෝධනයක් සිදු නොවන බැවින්, බලශක්ති හා ප්‍රවාහන උද්ධමනය පෙර පුරෝකථනය කළ මට්ටමට වඩා අඩු වේගයකින් ඉහළ යනු ඇතැයි නව පුරෝකථනයන්හි අපේක්ෂා කෙරේ. සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ මතුපිට උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන යමින් 5%ක ඉලක්කගත මට්ටමට ළඟා වනු ඇතැයි මැදි කාලීන පුරෝකථන පෙන්නුම් කරයි.

රූප සටහන 02: මතුපිට උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)
2026 වසරේ ජනවාරි මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



***2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී මහ බැංකුව සහ මුදල් අමාත්‍යවරයා අතර අත්සන් කරන ලද මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම යටතේ උද්ධමන ඉලක්කය (5%) සඳහා එකඟ වී ඇත.*

සටහන: උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted) මත පදනම් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ

2026 වසරේ ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්වයන් පුරෝකථන මගින් පිළිබිඹු කෙරේ. ගෝලීය බලශක්ති සහ ආහාර මිල පිළිබඳ වන පුරෝකථන; ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික වර්ධනය; රජයේ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම; සහ එක්සත් ජනපද මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව යනාදී කරුණු මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘති සමඟ අනුකූල වන පොලී අනුපාතික මාර්ගය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වන විනිමය අනුපාතිකය ද ඇතුළු සාර්ව ආර්ථික විචල්‍යයන්හි හැසිරීම මත පුරෝකථන රඳා පවතී. තවද, මූලික පුරෝකථනවල දී ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලින් විශාල වශයෙන් විතැන් වීමක් අපේක්ෂා නොකෙරේ. එබැවින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න මෙමගින් ගම්‍ය වේ. මෙම උපකල්පනවලින් සැලකිය යුතු ලෙස අපගමනය වීම සැබෑ උද්ධමනය, පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. උද්ධමන ව්‍යාප්ති සටහන් සමඟ මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන එක් එක් මුදල් ප්‍රතිපත්ති වාරය තුළ අඛණ්ඩව යාවත්කාලීන කෙරේ. වෙනස්වන ගෝලීය පරිසරය සහ දේශීය ආර්ථිකයේ ඇති අවිනිශ්චිතතා හමුවේ, සැබෑ දත්ත මූලික පුරෝකථනවලට වඩා ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා අවදානම් පවතී. මූලික පුරෝකථන සම්බන්ධයෙන් ඇති අවදානම් පිළිබඳ විස්තර "වාර්තා වන සැබෑ දත්ත මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම්" කොටසේ දී සාකච්ඡා කෙරේ.

ආර්ථිකයේ යටිදැරි ඉල්ලුම් තත්ත්ව පිළිබිඹු කරන මූලික උද්ධමනය, ක්‍රමයෙන් ඉහළ ගොස් මතුපිට උද්ධමන ඉලක්කයට අනුකූල මට්ටමක ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය ඉල්ලුම් තත්ත්වවල අපේක්ෂිත ශක්තිමත් වීම මූලික උද්ධමනයේ මෙම ක්‍රමික ඉහළ යෑම සඳහා සහාය වනු ඇතැයි අපේක්ෂිතය. මීට අමතරව, ගෝලීය ආහාර මිල ගණන් සහ ගෝලීය උද්ධමන ප්‍රවණතා මගින් යම්තාක් දුරකට බලපෑමට ලක් වන ආනයන උද්ධමනය ද මූලික උද්ධමනයේ අපේක්ෂිත ප්‍රවණතාවට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සාධක මගින්, මූලික භාණ්ඩ හා සේවා පැසට අයත් නොවන නිතර මිල උච්චාවචනය වන ආහාර සහ බලශක්ති හා ප්‍රවාහන සංරචක හැර, එදිනෙදා භාණ්ඩ සහ සේවාවල යටිදැරි පිරිවැය ව්‍යුහය ඉදිරි කාලයේ දී වෙනස් වනු ඇතැයි අපේක්ෂා කරන ආකාරය පෙන්නුම් කෙරේ. මෙය ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතාවල පුරෝකථන මාර්ගය පෙන්නුම් කරයි.

රූප සටහන **03**: **මූලික උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)**
2026 වසරේ ජනවාරි මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



සටහන: උද්ධමන ව්‍යාප්ති සටහනෙහි වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2021=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted) මත පදනම් වේ.
ඉහත 02 රූප සටහනෙහි පැහැදිලි කිරීමේ සටහන බලන්න

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

වසර දෙකකට ආසන්න කාලයක් ඉහළ සෘණ මට්ටම්වල පැවති බලශක්ති හා ප්‍රවාහන උද්ධමනය, මෑත මාසවල දී අඩු අවධමන මට්ටම්වලට ළඟා වෙමින්, ක්‍රමයෙන් ඉහළ යෑමක් වාර්තා කළේය. සංඛ්‍යානමය පදනම් බලපෑම යම්තාක් දුරකට හේතුවෙමින් නුදුරු කාලයේ දී බලශක්ති හා ප්‍රවාහන උද්ධමනය ධන අගයක් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය මතුපිට උද්ධමනය, උද්ධමන ඉලක්කය කරා ක්‍රමයෙන් ඉහළ යෑමට දායක වනු ඇත. කෙසේ වෙතත්, බලශක්ති හා ප්‍රවාහන උද්ධමනය ගෝලීය ඉන්ධන මිල ප්‍රවණතා මත රඳා පවතින අතර, විශේෂයෙන් ම, මෑත කාලීනව භූ දේශපාලනික අර්බුද ඉහළ යෑම මධ්‍යයේ, එම අපේක්ෂිත ගෝලීය

ප්‍රවණතා මත ඉහළ අවිනිශ්චිතතා පවතී. කාලගුණය සම්බන්ධ අවිනිශ්චිතතා ද බලශක්ති උද්ධමනය සඳහා වන ඉදිරි දැක්මේ යම් වෙනස් වීමවලට හේතු විය හැකිය.

රූප සටහන 04: බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය: මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම (කො.පා.මි.ද., 2021=100)[5]



මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

මේ අතර, උද්ධමනයේ අනෙකුත් සංරචකවලට සාපේක්ෂව, නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනය නුදුරු කාලයේ දී ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දිට්වා සුළි කුණාටුවේ ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික නිෂ්පාදනයට ඇති වූ බලපෑම, විශේෂයෙන්, සාමාන්‍ය නිෂ්පාදන සහ අස්වනු නෙලීමේ චක්‍රවලට ඇතිවිය හැකි බාධා සහ ප්‍රමාදවීම් හේතුවෙන් නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනය ඉහළ යෑම සඳහා යම් බලපෑමක් ඇති කළ හැකිය. කෙසේ වෙතත්, සුළි කුණාටුවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල කඩිනමින් නැවත වගා කිරීමේ සහ යළි නගා සිටුවීමේ ප්‍රයත්න මෙම බලපෑම අවම කිරීමට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෑත කාලීනව නිතර ඇති වූ අහිතකර කාලගුණික තත්ත්වවල බලපෑම් සැලකිල්ලට ගැනීමේ දී, නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනයේ ඉදිරි කාලීන ප්‍රවණතා සැලකිය යුතු ලෙස අවිනිශ්චිතව පවතිනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

රූප සටහන 05: මතුපිට උද්ධමනය: මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම (කො.පා.මි.ද. 2021=100)[5]



මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

[5] මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම පිළිබඳ සවිස්තරාත්මක විමසීමක් සඳහා කරුණාකර 2025 වසරේ අගෝස්තු මස මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ විශේෂ සටහන (අ) බලන්න

උද්ධමන අපේක්ෂා

මහ බැංකුව විසින් සිදු කළ උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයට අනුව, ආයතනික අංශයේ කෙටි කාලීන උද්ධමන අපේක්ෂා සමස්තයක් ලෙස වාර්තා වූ සැබෑ උද්ධමනයට අනුකූලව පැවතුණි. ඒ අනුව, ඉදිරි මාස 3ක, 6ක සහ අවුරුද්දක උද්ධමන අපේක්ෂා 2025 වසරේ ජූනි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. මේ අතර, ආයතනික අංශයේ මැදි කාලීන උද්ධමන අපේක්ෂා, එනම් ඉදිරි වසර 2 සහ වසර 3 සඳහා උද්ධමන අපේක්ෂා, එම කාලය තුළ ඉහළ යමින් 5%ක උද්ධමන ඉලක්කය කරා යොමු විය.

මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම

ඉදිරි ආර්ථික දිශානතිය පෙන්වන දර්ශක, සමීක්ෂණ ප්‍රතිඵල සහ කාර්යමණ්ඩල ඇගයීම් මත පදනම්ව, 2025 වසරේ පළමු කාර්තු තුනෙහි නිරීක්ෂණය කළ ස්ථායී වර්ධනයට සාපේක්ෂව, 2025 වසරේ හතරවන කාර්තුවේ මූර්ත ද.දේ.නි.යේ වර්ධනය යම් පහළ යෑමක් වාර්තා කර ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම පහළ යාම ප්‍රධාන වශයෙන් ම දිට්වා සුළි කුණාටුව ආශ්‍රිත බාධා හේතුවෙන් සිදු වූ අතර එය සියලු අංශවලට පොදුවේ බලපානු ඇතැයි අපේක්ෂා කරන නමුත්, කෘෂිකාර්මික නොවන අංශ සඳහා සුළු බලපෑමක් සිදු වී ඇතැයි අපේක්ෂා කෙරේ. නුදුරු කාලීන ආර්ථික වර්ධනයේ ඉදිරි දැක්ම මධ්‍යස්ථ තත්ත්වයක් පෙන්නුම් කරන අතර 2025 වසරේ දෙවන භාගයේ දී පැවති වර්ධන ප්‍රවණතාවල සංඛ්‍යානමය පදනම් බලපෑම් ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් 2026 වසරේ නුදුරු කාලීන වර්ධන අපේක්ෂා ඉහළ විචලනයක් පෙන්නුම් කරයි. ලිහිල් මුදල් තත්ත්වය ආර්ථික වර්ධනයට තවදුරටත් සහාය වන අතර ම, දිට්වා සුළි කුණාටුවෙන් පසු රජයේ වියදම් ඉහළ යෑම ද නුදුරු කාලීනව ආර්ථික වර්ධනයට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම පසුබිම තුළ, නුදුරු කාලයේ දී ශුන්‍යයට ආසන්න ලෙස ඇස්තමේන්තු කර ඇති නිමැවුම් පරතරය, මැදි කාලීනව ධන අගයක් වනු ඇතැයි පුරෝකථනය කෙරේ. මේ අතර, අපේක්ෂිත ප්‍රාථමික ගිණුම් අතිරික්තය හේතුවෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හරහා ආර්ථික වර්ධනය කෙරෙහි වන ඉල්ලුම් බලපෑම ඍණාත්මක වීම, මැදි කාලීන වර්ධන ප්‍රවණතාව සඳහා යම් තරමකට බලපෑම් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, දියුණු මෙන්ම නැගී එන වෙළඳපොළ ආර්ථිකවල වර්ධන වේගය මන්දගාමී වන පසුබිමක, දැනට පවතින ධනාත්මක විදේශ නිමැවුම් පරතරය නුදුරු කාලීනව අඩු වී ඍණ මට්ටමක් වනු ඇතැයි ද මැදි කාලීනව ඍණාත්මකව පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

පුරෝකථනය කරන ලද මැදි කාලීන ආර්ථික වර්ධන ඉදිරි දැක්ම සම්බන්ධයෙන් සැලකිය යුතු අවිනිශ්චිතතා පවතින බව අවධාරණය කළ යුතු කරුණකි. දැනට පවතින ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවතීම ඉලක්කගත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ වර්ධන උපායමාර්ග කඩිනම්ව සහ ඵලදායීව ක්‍රියාවට නැංවීම මත රඳා පවතී. තවද, නිතර ඇතිවන කාලගුණය හා සම්බන්ධ බාධා මැදි සහ දිගු කාලීන වර්ධනය සීමා කළ හැකි අතර, එම තත්ත්වය තිරසර සහ කාලගුණය හා සම්බන්ධ බාධාවලට ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කරන ප්‍රතිපත්තිවල අවශ්‍යතාව අවධාරණය කරයි. ගෝලීය වෙළඳ සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතතා මධ්‍යයේ ශ්‍රී ලංකාවේ වෙළඳ පාර්ශ්වකරුවන්ගේ වර්ධන ඉදිරි දැක්මෙහි සිදුවන ප්‍රවණතා ද ඉදිරි කාලය තුළ ශ්‍රී ලංකාවේ වර්ධන මාවත හැඩගස්වනු ඇත.

රූප සටහන 06: කාර්තුමය මූර්ත ද.දේ.නි.යේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යාමය, %)
2026 වසරේ ජනවාරි මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



ඉහත 02 රූප සටහනෙහි පැහැදිලි කිරීමේ සටහන බලන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

2.2. පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන

2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී එළැඹුණු මැදි කාලීන පුරෝකථන සඳහා භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පනවල සාරාංශයක් මෙම කොටසේ දක්වා ඇත.

ගෝලීය පරිසරය

එක්සත් ජනපදයේ මෑත කාලීන වෙළඳ ප්‍රතිපත්ති ප්‍රවණතා සහ වත්මන් භූ දේශපාලනික අර්බුද මධ්‍යයේ ගෝලීය ආර්ථික තත්ත්ව ඉහළ අවිනිශ්චිතතාවයකට ලක්ව ඇතත්, 2025 වසර සඳහා වන ගෝලීය වර්ධන ප්‍රවණතා සහ 2026 වසර සඳහා වන ඉදිරි දැක්ම මීට පෙර අපේක්ෂා කළ මට්ටමට වඩා ශක්තිමත් වී ඇත. වෙළඳාම හා සම්බන්ධ ගැටලු, භූ දේශපාලනික අවිනිශ්චිතතා සහ තවමත් සාපේක්ෂව දැඩි ගෝලීය මූල්‍ය තත්ත්ව තිබියදීත් දියුණු සහ නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි ආර්ථික ක්‍රියාකාරකම් නුදුරු කාලීනව සාපේක්ෂව ශක්තිමත්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර මැදි කාලීනව ක්‍රමයෙන් මධ්‍යස්ථ වනු ඇත. Global Projections Model Network (GPMN),[6] හි පුරෝකථනයට අනුව, අපනයන අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය[7] පහළ

[6] මහ බැංකුව මැදි කාලීන පුරෝකථන සිදු කිරීම සඳහා GPMN විසින් සකස් කරන ලද ගෝලීය සාර්ව ආර්ථික දර්ශකවල පුරෝකථන භාවිත කරයි. 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිත තරන ලද පුරෝකථන 2026 වසරේ ජනවාරි 20 දින GPMN මගින් ලබා දුන් පුරෝකථන මත පදනම් වී ඇත.

[7] ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් හය දෙනෙකුට අනුරූප වන සමස්ත අපනයනයේ ප්‍රමතකරණය කරන ලද අනුපාත භාවිත කර GPMN පුරෝකථනයන්හි සපයා ඇති වෙළඳ හවුල්කරුවන්ගේ නිමැවුම් පරතරවල බරිත සාමාන්‍ය නිමැවුම් පරතරයක් ලෙස අපනයනය අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය ගණනය කෙරේ.

ගොස් 2026 වසර අවසානය වන විට සෘණ අගයක් ගනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, එක්සත් ජනපදය, යුරෝ කලාපය සහ එක්සත් රාජධානියේ ආර්ථිකයන්හි අපේක්ෂිත මන්දගාමී වීම මධ්‍යයේ එය මැදි කාලීනව පහළ මට්ටමක පවතිනු ඇතැයි අපේකෂා කෙරේ. අඛණ්ඩ උද්ධමන පීඩන හමුවේ, උද්ධමන අවදානම් සහ ඉහළ අවිනිශ්චිතතා සැලකිල්ලට ගනිමින් එක්සත් ජනපද ෆෙඩරල් සංචිතය ප්‍රවේශම්කාරී ස්ථාවරයක් පවත්වා ගැනීමත් සමඟ, එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම ක්‍රමයෙන් සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. භූ දේශපාලනික ප්‍රවණතා සහ ඉහළ යන ගෝලීය ඉල්ලුම් තත්ත්ව මඟින් භාණ්ඩ වෙළඳපොළ වෙත බලපෑම් එල්ල වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පුරෝකථන කාලපරාසය ආරම්භයේ දී බ්‍රෙන්ට් බොරතෙල් මිල ගණන් පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරන නමුත්, පසුව ක්‍රමයෙන් ඉහළ යෑමක් වාර්තා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආහාර උද්ධමනය නුදුරු කාලීනව සෘණ අගයක් වනු ඇතැයි ද ඉන් පසුව ක්‍රමයෙන් ඉහළ යනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මග

2025 දෙසැම්බර් මාසයේ දී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කළ 2026 වසර සඳහා වන පරිපූරක ඇස්තමේන්තුව අනුව, වත්මන් පුරෝකථනවල ඇතුළත් කර ඇති රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන්මග හා සම්බන්ධ උපකල්පන යාවත්කාලීන කර ඇත.

විදේශීය ජංගම ගිණුම

2025 දෙසැම්බර් මාසයේ දී මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කළ 2026 වසර සඳහා වන පරිපූරක ඇස්තමේන්තුව අනුව, වත්මන් පුරෝකථනවල ඇතුළත් කර ඇති රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන්මග හා සම්බන්ධ උපකල්පන යාවත්කාලීන කර ඇත.

2.3. වාර්තා වන සැබෑ දත්ත මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම්

වාර්තා විය හැකි සැබෑ උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය, මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූලික පුරෝකථනවලට වඩා ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා ද අවදානම් පවතී. 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයට අදාළව, එවැනි අවදානම් පිළිබඳ පැහැදිලි කිරීමක් මෙම කොටසෙහි සපයා ඇත. මෙම කොටසෙහි සාකච්ඡා කර ඇති අවදානම් එකක් හෝ කිහිපයක් සාක්ෂාත් වීම වාර්තා වන උද්ධමනය සහ/ හෝ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය පුරෝකථනය කළ මූලික ගමන්මගින් වෙනස් වීමට හේතු විය හැකිය. ඉහළ යෑමේ සහ පහළ යෑමේ අවදානම් දෙඅංශය ම සාක්ෂාත් වීමක දී වාර්තා වන සැබෑ උද්ධමනයේ හෝ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන දිශානතිය එම අවදානම්වල සාපේක්ෂ ප්‍රබලතාවය මත රඳා පවතිනු ඇත.

වාර්තා වන සැබෑ උද්ධමනය මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම්

උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා ඉහළ යෑම සඳහා අවදානම් කිහිපයක් හේතු විය හැකිය. ඉහළ ණය වර්ධනය සහ යථා තත්ත්වයට පත් වන ආර්ථික ක්‍රියාකාරකම් මධ්‍යයේ ඉල්ලුම් පීඩන ක්‍රමයෙන් වර්ධනය වන අතර, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සිදු කළ ගෙවීම් ද නුදුරු කාලීන පරිභෝජනය ඉහළ නැංවීමටට බලපෑ හැකිය. ණය වර්ධනය ආර්ථික කටයුතු සඳහා සම්ප්‍රේෂණය වීම ආවේණිකව ම යම් කාල පමාවකින් සිදු වීම මධ්‍යයේ, මෑතකාලීනව පැවැති පෞද්ගලික අංශයේ ඉහළ ණය වර්ධනය මැදි කාලීනව ඉල්ලුම් පීඩන ඉහළ

යෑමේ අවදානම් ඇති කළ හැකිය. අපේක්ෂිත මට්ටමට වඩා වේගයෙන් ආනයන ඉල්ලුම ඉහළ ගියහොත් ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම පුරෝකථන ඉක්මවා යෑම සිදු විය හැකිය. ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සහ දිට්වා සුළි කුණාටුව සම්බන්ධ නැවත ගොඩනැගීමේ කටයුතු හේතුවෙන් ආනයන ඉහළ යා හැකි අතර, අපේක්ෂා කළ මට්ටමට වඩා වැඩි වෙළඳ හිඟය මගින් විදේශ විනිමය ඉල්ලුම ඉහළ නැංවීමට සහ විනිමය අනුපාතිකය මත පීඩනයක් ඇති කිරීමට ඉඩ ඇත. නිතර සිදුවන අහිතකර කාලගුණික තත්ත්ව කෘෂිකාර්මික නිෂ්පාදනයට බාධා ඇති කර විදුලි උත්පාදන ප්‍රභව මිශ්‍රණයේ වෙනස්කම් ඇති කළ හැකි අතර, පසෙහි ගුණාත්මකභාවය අඩුවීම කාලයත් සමඟ කෘෂිකාර්මික ඵලදායීතාව අඩු වීමට හේතු විය හැකිය. මේ සමඟ ඇති විය හැකි දිගු කාලයක් පුරා පවතින සැපයුම් අංශයේ බාධා ආහාර සහ බලශක්ති මිල ඉහළ යෑමට බලපානු ඇත. මෙම බලපෑම් අඛණ්ඩව පැවතුනහොත්, උද්ධමනය වත්මන් පුරෝකථන ඉක්මවා යා හැකිය. එක්සත් ජනපද සහ වෙනත් ප්‍රධාන ආර්ථිකවල පැතිරී පවත්නා දිගුකාලීන අවිනිශ්චිතතා සමඟ ගෝලීය භූ දේශපාලනික සහ සාර්ව ආර්ථික තත්ත්ව නිතර වෙනස් වෙමින් පවතී. ගෝලීය සැපයුම් දාමවලට සහ භාණ්ඩ වෙළඳපොළට ඇතිවන බාධා මිල උච්චාවචන ඉහළ නැංවිය හැකි අතර, දේශීය උද්ධමනය ඉහළ යෑමේ අවදානමක් ඇති කළ හැකිය.

උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා පහළ යෑමේ අවදානම් සැලකූ විට, මෑතකාලීනව උද්ධමනය ක්‍රමිකව ඉහළ ගිය ද, අපේක්ෂිත කාලයට වඩා දිගු කලක් පහළ මට්ටමේ පැවතීමේ හැකියාවක් ඇත. වැටුප් සංශෝධන සහ පරිපාලිත මිල ගණන් සංශෝධන ද ඇතුළත්ව, මිල ගණන් වෙනස් වීම සෙමෙන් සිදු වීමේ ස්වභාවය උද්ධමනය ඉලක්කගත මට්ටමට ආපසු ළඟාවීම මන්දගාමී වීමට හේතු විය හැකිය. දිට්වා සුළි කුණාටුවෙන් වූ බලපෑම්වලින් පසු යළි වගා කිරීම් කටයුතු අඛණ්ඩව වැඩි දියුණු වීම මගින් කෘෂිකාර්මික නිෂ්පාදනයට සහ ආහාර මිල පීඩන අවම කිරීමට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඉලක්කගත රාජ්‍ය සහාය කෘෂිකාර්මික සැපයුම තවදුරටත් ශක්තිමත් කිරීමට හේතු විය හැකිය. ගෝලීය තෙල් මිල ගණන් පහළ යෑම පිළිබිඹු කරමින්, අපේක්ෂිත මට්ටමට වඩා අඩු වේගයකින් සිදු විය හැකි ඉන්ධන මිල ඉහළ යෑම බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය පහළ දමනු ඇත. ගෝලීය මිල වෙනස්වීම් සහ තීරුබදු සංශෝධන හා සම්බන්ධ අවිනිශ්චිතතා හේතුවෙන් උද්ධමන පුරෝකථන වෙත අවදානම් ඇති වීමේ ස්වභාවය තවදුරටත් පවතී.

වත්මන් මුදල් ප්‍රතිපත්ති වාරයේ විනිශ්චයන්ට අනුව, උද්ධමන පුරෝකථන සඳහා ඇති අවදානම් නුදුරු කාලීනව මෙන්ම මැදි කාලීනව තුලිතව පවතිනු ඇතැයි තක්සේරු කර ඇත.

වාර්තා වන සැබෑ ආර්ථික වර්ධනය මූලික පුරෝකථනවලින් අපගමනය වීමට ඇති අවදානම්

ගෝලීය වෙළඳාම සම්බන්ධ ගැටලු සහ ඉහළ ගිය භූ දේශපාලනික අවිනිශ්චිතතා ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ සහ ප්‍රධාන සංචාරක මූලාශ්‍ර වෙළඳපොළවල වර්ධනයට අහිතකර බලපෑම් ඇති කිරීම හරහා, නුදුරු කාලයේ සිට මැදි කාලය තුළ ආර්ථික වර්ධනය පුරරෝකථනය කළ මට්ටමට වඩා පහළ යෑමේ අවදානම් ඇති විය හැකිය. ගෝලීය වශයෙන් වූ අඩු වර්ධනය සහ ඉහළ අවිනිශ්චිතතා සංචාරක පැමිණීම සහ සංචාරක සේවා අපනයනය දුර්වල කළ හැකි අතර, ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ඉල්ලුම ද අඩු කරනු ඇත. මෙම බාහිර අභියෝග සමස්ත ආර්ථික ක්‍රියාකාරකම් සහ වර්ධන අපේක්ෂා මත පීඩන ඇති කරමින් අපනයන ආදායම් සහ විදේශ විනිමය ලැබීම් අඩු කිරීමට දායක විය හැකිය. ආර්ථික වර්ධනය පුරෝකථනය කළ මට්ටමට වඩා ඉහළ යෑමට හේතු විය හැකි ධනාත්මක බලපෑම් සැලකූ විට, දිට්වා සුළි කුණාටුවෙන් වූ බලපෑම්වලින් පසු අපේක්ෂා

කළ ප්‍රමාණයට වඩා වේගවත් යථා තත්ත්වයට පත්වීම, විශේෂයෙන් කෘෂිකාර්මික හා ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීම, ආර්ථික වර්ධනයට සහාය විය හැකිය. යටිතල පහසුකම් යළි ගොඩනැගීම සහ කාලීන රාජ්‍ය සහාය ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම ශක්තිමත් කරමින් සේවා අංශයට ද ධනාත්මක අතුරු බලපෑම් සිදු කරනු ඇති අතර පුළුල් ලෙස ආර්ථික ප්‍රසාරණය සඳහා ඉඩ සලසනු ඇත.

2.4. පෙර පුරෝකථන සමඟ සැසඳීම [8]

මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කළ ප්‍රධාන උපකල්පන

2025 වසරේ අගෝස්තු මස මුදල් ප්‍රතිපත්ති වාර්තාව සඳහා භාවිත කරන ලද 2025 වසරේ ජූලි මාසයේ පැවති ගෝලීය පුරෝකථන තොරතුරු සමඟ සසඳන විට, 2026 වසරේ ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිත කරන ලද ගෝලීය පුරෝකථනවලට අනුව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපනයන අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය පිළිබඳ ඉදිරි දැක්ම වර්ධනය වී ඇත. එක්සත් ජනපදය හා යුරෝ කලාපයේ ආර්ථිකයන්ට අදාළ පුරෝකථන සංශෝධනය වීම මෙම වෙනසට මූලික වශයෙන් හේතු වී ඇත. 2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරය තුළ භාවිතා කරන ලද ගෝලීය පුරෝකථන මගින්, 2025 වසරේ ජූලි මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථනවලට සාපේක්ෂව ආහාර උද්ධමනය 2026 වසර තුළ අඩු වී, ඉන් අනතුරුව 2027 වසර තුළ දී තරමක් ඉහළ යන බව පෙන්නුම් කරයි. භූ දේශපාලනික අස්ථාවරත්වය හේතුවෙන් හට ගන්නා අවිනිශ්චිතතා තුලනය කරන අතරතුර, සැපයුම වැඩිදියුණු වීමේ අපේක්ෂාවන් මධ්‍යයේ, ගෝලීය තෙල් මිල ගණන් 2025 වසරේ ජූලි මාසයේ දී පුරෝකථනය කරන ලද ප්‍රමාණයට සාපේක්ෂව අඩු මට්ටමක පවතින ලෙස සංශෝධනය කර ඇත. මේ අතර, මන්දගාමී ශ්‍රම වෙළඳපොළ තත්ත්ව මධ්‍යයේ මැදි කාලීනව අඩු ප්‍රතිපත්ති පොලී අනුපාතික තිබෙනු ඇතැයි පවතින අපේක්ෂා පිළිබිඹු කරමින්, එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම පෙර පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා වේගවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වත්මන් පුරෝකථනවල රාජ්‍ය මූල්‍ය ගමන් මග 2026 වසරේ පරිපූරක අයවැය ඇස්තමේන්තුවේ ඉදිරිපත් කළ තොරතුරු පදනම්ව සංශෝධනය කෙරුණු අතර, 2025 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන 2026 වසරේ රාජ්‍ය මූල්‍ය උපායමාර්ග ප්‍රකාශය මත පදනම් විය. අනෙකුත් වෙනස්කම් අතර, 2026 වසර සඳහා ඉහළ අයවැය හිඟයක් නවතම තොරතුරු තුළ අන්තර්ගත කර ඇත.

[8] මෙම කොටස මගින් 2025 වසරේ අගෝස්තු මස මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඉදිරිපත් කරන ලද, 2025 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති පුරෝකථනයට සාපේක්ෂව වත්මන් පුරෝකථන සන්සන්දනය කෙරේ.

රූප සටහන 07: ගෝලීය පුරෝකථන (කාර්තුමය)



2025 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරය (2025 අගෝස්තු මුදල් ප්‍රතිපත්ති වාර්තාව)

2026 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරය (2026 පෙබරවාරි මුදල් ප්‍රතිපත්ති වාර්තාව)

සටහන: සැලකිල්ලට ගන්නා රටවල් බහුතරයක දත්ත සියල්ලම ලැබෙන තෙක් නවතම GPMN පුරෝකථනවල වඩාත්ම මෑත කාලීන දත්ත වාර්තා වූ කාලපරිච්ඡේදය ලෙස 2025 වසරේ තෙවන කාර්තුව සැලකේ

මූලයන්: කාර්තුමය පුරෝකථන ආකෘතිය, Global Projection Model Network (GPMN) (2025/06/25 සහ 2026/01/20 යාවත්කාලීන කිරීම්)

උද්ධමනයේ හැසිරීම

2025 වසරේ අගෝස්තු මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ප්‍රකාශයට පත් කරන ලද පුරෝකථන හා සැසඳීමේ දී 2025 වසරේ තුන්වන කාර්තුවේ වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය සමස්තයක් ලෙස පුරෝකථනය කළ මට්ටම ආසන්නයේ පැවතුණි. කෙසේවෙතත්, 2025 වසරේ සිව්වන කාර්තුවේ දී වාර්තා වූ උද්ධමනය පෙර පුරෝකථනයට වඩා මඳක් අඩුවෙන් පැවතුණි. ගෝලීය තෙල් මිල අඩු මට්ටමක හැසිරීම සහ මධ්‍යස්ථ ආහාර මිල ගණන් පිළිබිඹු කරමින්, උද්ධමන පුරෝකථන ද පෙර මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ සඳහන් වූ හැසිරීමට වඩා පහළ මට්ටමක පවතී. එයට අමතරව, යටිදැරි මිල ගණන් අපේක්ෂිත වැඩිවීමට වඩා මන්දගාමී වීම ද මෙම අඩු උද්ධමන ප්‍රවණතාවට හේතු වී ඇතැයි සැලකිය හැකිය. පෙර පුරෝකථනවලට අනුව යමින්, ආර්ථිකයේ ඉල්ලුම් තත්ත්වය ඉහළ යාමේ සහායයෙන්, උද්ධමනය ක්‍රමයෙන් වේගවත් වී මැදි කාලීනව උද්ධමන ඉලක්කය වෙත යොමු වනු ඇතැයි අපේක්ෂා කෙරෙයි. නුදුරු කාලයේ දී මූලික උද්ධමනය පෙර මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ අපේක්ෂිත මට්ටමට වඩා සමස්තයක් ලෙස අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර, දේශීය ඉල්ලුම ශක්තිමත් වීම පිළිබිඹු කරමින් පුරෝකථන කාලපරිච්ඡේදයේ අවසාන කොටසේ දී තරමක ඉහළ අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

3. වර්තමාන ආර්ථික තත්ත්වය

3.1. උද්ධමනය

මාස එකොළහක අවධමනයකින් පසුව 2025 වසරේ අගෝස්තු මාසයේ දී මතුපිට උද්ධමනය ධන අගයකට පත් වූ අතර, අනතුරුව ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළද, එය ඉලක්කගත මට්ටමට වඩා පහළ අගයක පැවතුණි.

රූප සටහන 08: මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම (කො.පා.මි.ද., 2021=100)



මූලය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මාස එකොළහක අවධමන කාලපරිච්ඡේදය නිමා කරමින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද, 2021=100) පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2025 වසරේ අගෝස්තු මාසයේ දී ධන අගයකට පත් විය. මෙම පරිවර්තනය සඳහා 2025 වසරේ ජූනි මස මැද භාගයේ දී විදුලි ගාස්තු ඉහළ දමමින් සිදු කළ සංශෝධන හේතුවෙන් බලශක්ති සහ ප්‍රවාහන අංශයේ අවධමන පීඩන ලිහිල් වීම සමඟ සංඛ්‍යානමය පදනම් බලපෑම ප්‍රධාන වශයෙන් හේතු විය. ඉන් අනතුරුව, කො.පා.මි.ද. පදනම් කරගත් මතුපිට උද්ධමනය ක්‍රමයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් 2025 වසරේ ඔක්තෝබර් මාසයේ දී 2.1%ක් දක්වා ඉහළ ගිය අතර, 2025 වසරේ දෙසැම්බර් මාසය දක්වා එම අගය නොවෙනස්ව පැවතුණි.[9] දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සැපයුම් දාමයන්ට ඇති වූ බාධා සහ උත්සව සමයේ දී ආහාර සඳහා පැවති ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් ආහාර මිල ගණන් මාසිකව ඉහළ ගිය ද, හිතකර සංඛ්‍යානමය පදනම් බලපෑම් හේතුවෙන්, 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය තුළින් එම බලපෑම පිළිබිඹු නොවිය. මේ අතර, කො.පා.මි.ද. පදනම් කර ගත් වාර්ෂික ලක්ෂ්‍යමය ආහාර උද්ධමනය 2025 වසරේ ජූනි මාසයේ වාර්තා වූ 4.3%ක අගයේ සිට 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී 3.0%ක් දක්වා පහළ ගිය අතර, වාර්ෂික ලක්ෂ්‍යමය ආහාර නොවන උද්ධමනය එම කාල පරිච්ඡේදයේ දී -2.8%ක අගයේ සිට 1.8%ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද, 2021=100) පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2025 වසරේ දෙවන භාගයේ දී සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඒ අනුව, ජා.පා.මි.ද. පදනම් කරගත්

[9] කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2026 වසරේ ජනවාරි මාසයේ දී 2.3%ක් දක්වා ඉහළ ගියේය.

මතුපිට උද්ධමනය 2025 වසරේ ජූනි මාසයේ වාර්තා වූ 0.3%ක අගයේ සිට 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී 2.9%ක් දක්වා ඉහළ ගියේය.

රූප සටහන 09: වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද.)



සටහන: 2018 වසරේ අරමුණ අනුව ඒකපුද්ගල පරිභෝජනය වර්ගීකරණය (Classification of Individual Consumption According to Purpose 2018) භාවිත කරමින් සමස්ත (මතුපිට) පාරිභෝගික මිල දර්ශකයේ භාණ්ඩ හා සේවා පැසවලින් (2021=100) සේවා සම්බන්ධ සංරචක උකහා ගෙන ඇත

මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

රූප සටහන 10: වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා උපකාණ්ඩ අනුව දායකත්වය (කො.පා.මි.ද.)



සටහන: කො.පා.මි. දර්ශකයේ උපකාණ්ඩවල බර තැබීම් වරහන් තුළ දක්වා ඇත. 2025 වසරේ අගෝස්තු මස මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීමෙන් පසු වර්ධනයන් පිළිබිඹු කිරීම සඳහා, 2025 වසරේ දෙසැම්බර් සඳහා ලබා ගත හැකි නවතම දත්ත 2025 වසරේ ජූනි මාසයේ දී වාර්තා වූ දත්ත සමඟ සංසන්දනය කර ඇත.

මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

කො.පා.මි.ද. පදනම් කරගත් මාසික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය, 2025 වසරේ ජූලි සහ අගෝස්තු මාසවල දී සුළු වශයෙන් පහළ ගිය අතර, 2025 වසරේ ජූනි මස මැද භාගයේ දී ක්‍රියාවට නැංවූ විදුලි ගාස්තු ඉහළ දමමින් සිදු කළ සංශෝධන හේතුවෙන් ඉහළ ගිය උද්ධමන පීඩනය යටපත් කරමින්, යල කන්නයේ අස්වැන්න ලැබීමත් සමඟ ආහාර මිල ගණන් පහළ යැම ඊට හේතු විය. අස්වැන්න ආශ්‍රිත සැපයුම් සාධක සාමාන්‍යකරණය වීමත් සමඟ මාසික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය 2025 වසරේ සැප්තැම්බර් මාසයේ දී සුළු වශයෙන් ඉහළ යැමක් වාර්තා කළ අතර, 2025 වසරේ ඔක්තෝබර් මාසයේ දී එය බොහෝ දුරට නොවෙනස්ව පැවතුණි. කෙසේ වුව ද, 2025 වසරේ නොවැම්බර් මාසයේ දී මාසික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය පහළ ගිය අතර, නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතම කිහිපයක මිල ගණන් අඩු වීම ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. ඉන් අනතුරුව, මාසික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී කැපී පෙනෙන අයුරින් ඉහළ ගිය අතර, දිට්වා සුළි කුණාටුව හේතුවෙන් සැපයුම් දාමයට ඇති වූ බාධා මෙන්ම උත්සව සමයේ දී ඉල්ලුම ඉහළ යැම එමගින් පෙන්නුම් කෙරිණි.

රූප සටහන 11 : මාසික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද.)



මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යාමය මූලික උද්ධමනය, 2025 වසරේ දෙවන භාගයේ දී අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, මූලික උද්ධමනය, 2025 වසරේ ජූනි මාසයේ දී වාර්තා වූ 1.5%ක අගයේ සිට 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී 2.7%ක් දක්වා ඉහළ ගියේය.[10] ඒ හා සමානව, ජා.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යාමය මූලික උද්ධමනය 2025 වසරේ ජූනි මාසයේ පැවති 0.6%ක අගයේ සිට 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී 2.6%ක අගයක් වාර්තා කරමින් ඉහළ යැමේ වර්ධන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.

[10] 2026 වසරේ ජනවාරි මාසයේ දී, කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යාමය මූලික උද්ධමනය 2.3%ක් ලෙස වාර්තා විය.

රූප සටහන 12 : මතුපිට උද්ධමනය (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය,%) විවිධ වර්ණ රූප සටහන



සටහන: 2023 ජනවාරි මාසයට පෙර දත්ත කො.පා.මි.ද.(2013=100) මත පදනම් වන අතර, 2023 ජනවාරි මාසයේ සිට ආරම්භ වන දත්ත කො.පා.මි.ද.(2021=100) මත පදනම් වේ. කො.පා.මි.ද.(2021=100) මත පදනම්ව, වරහන් තුළ මූලික බර තැබීම් සඳහන් කර ඇත. උස මගින් සාපේක්ෂව කාණ්ඩයක මූලික බර තැබීම (සියලු අයිතමයන් අවස්ථාවේ දී හැර) නිරූපණය වේ.

2025 වසරේ පළමු කාර්තුවේ දී සහ 2025 වසරේ දෙවන කාර්තුවේ දී යන අනුක්‍රමික කාර්තු දෙකක දී කාර්තුමය මතුපිට උද්ධමනය, මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුම මගින් දක්වා ඇති 5%ක ඉලක්කයෙන් ±2ක ආන්තිකයට වැඩි අගයකින් අපගමනය වීම හේතුවෙන්, මහ බැංකු පනතේ 26(5) වගන්තිය යටතේ ඒ පිළිබඳ වාර්තාව ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට මහ බැංකුව කටයුතු කළ අතර, මහජනතාවට ද ලබාගත හැකි අයුරින් නිකුත් කරන ලදී. මෙය උද්ධමනය, උද්ධමන ඉලක්කයට වඩා අවම වීම හේතුවෙන් මහ බැංකුව විසින් එලෙස ඉදිරිපත් කළ සිව්වන වාර්තාවයි. තව ද, 2025 වසරේ දෙවන කාර්තුවේ දී සහ 2025 වසරේ තෙවන කාර්තුවේ දී යන අනුක්‍රමික කාර්තු දෙකක දී ද කාර්තුමය මතුපිට උද්ධමනය 3%ක පහළ ආන්තිකයට වඩා අවම අගයක පැවතීම හේතුවෙන් මහ බැංකුව ඒ පිළිබඳ පසු විපරම් වාර්තාවක් (පස් වන) මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇත. තව ද, 2025 වසරේ සිව්වන කාර්තුවේ දී වාර්තා වූ උද්ධමනය අවම ආන්තිකයෙන් පහළ මට්ටමක පැවතීම හේතුවෙන් මහ බැංකුව මීළඟ පසු විපරම් වාර්තාව (හය වන) 2026 වසරේ මුල් භාගයේ දී ඉදිරිපත් කරනු ඇත. පෙර කාර්තුවල දී මෙන්ම, මෑත කාලීන කාර්තුවල දී උද්ධමනය, උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීම සඳහා විශේෂයෙන් බලශක්ති සහ ප්‍රවාහන අංශයේ පැවති අඩු උද්ධමනය ඇතුළු සැපයුම් අංශයේ සාධක ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, පුරෝකථනය කළ පරිදි ම මෑත කාලීන කාර්තුවල උද්ධමනය, උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීම අවම වෙමින් පවතී.

විශේෂ සටහන (අ): ශ්‍රී ලංකාවේ මෑත කාලීන අවධමන තත්ත්වය පිළිබඳව ගැඹුරින් විමසා බැලීම

පසුගිය වසරවල මතුපිට උද්ධමනයේ හැසිරීම

මතුපිට උද්ධමනය 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්තාගත අයුරින් එහි උච්චතම අගය වාර්තා කිරීමෙන් පසුව නිර්-උද්ධමන කාලපරිච්ඡේදයකට අවතීර්ණ වූ අතර, 2023 වසර මැද භාගයේ දී තනි අගයක මට්ටම කරා ළඟා විය. උද්ධමනය පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවතිමින්, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී මතුපිට උද්ධමනය සෘණ අගයකට පත් වීමත් සමඟ, 1995 වසරෙන් පසු පළමු වරට[1] අවධමන තත්ත්වයක් වාර්තා විය. මෙම අවධමන තත්ත්වය මාස එකොළහක් පුරා පැවතුණි. 2025 වසරේ අගෝස්තු මාසයේ දී නැවතත් ධන අගයකට පත් වූ උද්ධමනය අනතුරුව ක්‍රමයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පවත්වා ගනිමින් පහළ ධන මට්ටම්වල පැවතුණි.

අවධමන තත්ත්වයට බලපෑ ප්‍රධාන කරුණු

මෙම අවධමන තත්ත්වය සඳහා සාධක කිහිපයක් බලපෑ අතර, ගෝලීය බලශක්ති මිල පහළ යන වාතාවරණය මධ්‍යයේ සිදු වූ පරිපාලිත මිල සංශෝධන ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරමින් බලශක්ති සහ ප්‍රවාහන අංශයේ මිල ගණන් අඩු වීම, එම අවධමන තත්ත්වය සඳහා වඩාත් කැපී පෙනෙන බලපෑමක් ඇති කළේය. බලශක්ති සහ ප්‍රවාහන අංශය තුළ උද්ධමනය පහළ යෑමට 2024 වසරේ මාර්තු හා ජූලි මාසවල දී සහ 2025 වසරේ ජනවාරි මාසයේ දී විදුලි ගාස්තු කැපී පෙනෙන අයුරින් පහළ දමමින් සිදු කළ මිල සංශෝධන ප්‍රධාන වශයෙන් හේතු විය. ඊට අමතරව, ප්‍රමාණාත්මකව අඩු මට්ටමකින් වුව ද, පෙට්‍රල්, ඔටෝ ඩීසල්, භූමිතෙල් සහ LP ගෑස් මිල ගණන් අවස්ථා කිහිපයක දී පහළ දමමින් සිදු කළ සංශෝධන ද මෙම අවධමන ප්‍රවණතාව තවදුරටත් පැවතීම සඳහා හේතු විය. කෙසේ වුව ද, බලශක්ති ආශ්‍රිත මිල ගණන් පහත යෑම සිදු වූයේ, පෙර වසරවලදී පිරිවැය පිළිබිඹු කරන මිලකරණය ක්‍රියාවට නැංවීම සමඟ ඉහළ පිරිවැය හා ගැලපෙන අයුරින්, ඉතිහාසයේ දක්නට නොලැබුණු පරිදි සිදු වූ මිල ගණන් ඉහළ දැමීමට පසුව බව අවධාරණය කළ යුතුය. තව ද, වාර්තා වූ අඩු මතුපිට උද්ධමනය සඳහා, යටපත් වූ ඉල්ලුම් පීඩන පිළිබිඹු කරන, අඩු මූලික උද්ධමනය[2] ද දායක විය. මෑත කාලීනව මූලික උද්ධමනය ආර්ථික අර්බුදයට පෙර පැවති මට්ටම්වලට වඩා අඩු මට්ටමක පැවතුණි (සාමාන්‍යයෙන්, 2010 සිට 2020 දක්වා කාලයේ දී මූලික උද්ධමනය 5%ක පමණ මට්ටමක පැවතුණි).

අ.1 රූප සටහන: මතුපිට, මූලික, බලශක්ති හා ප්‍රවාහන සහ නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනයෙහි හැසිරීම (කො.පා.මි.ද, 2006/7=100, 2013=100 සහ 2021=100, වාර්ෂික ලක්ෂ්‍යමය)



සටහන: එක් එක් කාණ්ඩයේ උද්ධමන අනුපාතික, සලකා බැලෙන කාල සීමාවට අදාළ පදනම් වර්ෂය මත පදනම්ව ගණනය කර ඇත. දත්ත සම්බන්ධ කිරීමේ දී, නිරීක්ෂණ කිහිපයක් පවතින කාල සීමා සඳහා මෑත කාලීන පදනම් වර්ෂයට ප්‍රමුඛතාව ලබා දී ඇත.

මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකු කාර්ය මණ්ඩල ගණනය කිරීම්

[1] එක් එක් කාණ්ඩයේ උද්ධමන අනුපාතික, සලකා බැලෙන කාල සීමාවට අදාළ පදනම් වර්ෂය මත පදනම්ව ගණනය කර ඇත. දත්ත සම්බන්ධ කිරීමේ දී, නිරීක්ෂණ කිහිපයක් පවතින කාල සීමා සඳහා මෑත කාලීන පදනම් වර්ෂයට ප්‍රමුඛතාව ලබා දී ඇත. අදාළ මාසයේ දී ප්‍රකාශට පත් කරන ලද කො.පා.මි.ද. සලකා බැලීමේ දී 2006/07=100 පදනම භාවිතයෙන් 2015 ජූලි - සැප්තැම්බර් කාලයේ දී සෘණ උද්ධමනය ප්‍රකාශයට පත්කර ඇති බව සැලකිය යුතුය. කෙසේ වුව ද, 2013=100 පදනම භාවිත කරන විට 2015 වසරේ දී එවැනි අවධමනයක් නිරීක්ෂණය කළ නොහැක.

[2] මූලික උද්ධමනය ව්‍යුත්පන්න කර ඇත්තේ ආහාර, බලශක්ති සහ ප්‍රවාහන අංශවල නිතර මිල උච්චාවචනය වන අයිතම මතුපිට උද්ධමනයෙන් බැහැර කිරීමෙනි. මෙම බැහැර කරන ලද අයිතම මෙම විශේෂ සටහනේ ඉදිරිපත් කර ඇති ප්‍රස්ථාරවල නිතර මිල උච්චාවචනය වන ආහාර සහ බලශක්ති සහ ප්‍රවාහන සංරචක ලෙස නිරූපණය කෙරේ.

අ.1 රූප සටහන මගින් මතුපිට උද්ධමනය, මූලික උද්ධමනය, බලශක්ති හා ප්‍රවාහන උද්ධමනය සහ නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනයෙහි හැසිරීම පෙන්නුම් කරයි. පසුගිය වසර හතරක කාලයේ දී බලශක්ති හා ප්‍රවාහන උද්ධමනයේ වාර්තා වූ අගය පරාසයන් අනෙකුත් සංරචකවලට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවති බව මෙයින් පෙන්නුම් කෙරේ. මේ අතර, අ.2 රූප සටහන මගින් මූලික උද්ධමනය, බලශක්ති හා ප්‍රවාහන උද්ධමනය සහ නිතර මිල උච්චාවචනය වන ආහාර උද්ධමනය මගින් මතුපිට උද්ධමනය සඳහා දායකත්වය නිරූපණය කෙරේ. බලශක්ති හා ප්‍රවාහන උද්ධමනයෙන් මතුපිට උද්ධමනයට එල්ල වූ සෘණාත්මක දායකත්වය මෑත කාලීනව සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පැවතුණි. ඒ අතර ම, මතුපිට උද්ධමනය සඳහා මූලික උද්ධමනයේ දායකත්වය ආර්ථික අර්බුදයට පෙර කාලයට සාපේක්ෂව අඩු මට්ටමක පැවති බව ද නිරීක්ෂණය කළ හැකි ය. ශ්‍රී ලංකාව මීට පෙර, විශේෂයෙන් 2009 වසර මැද භාගයේ සිට 2010 වසරේ ආරම්භය දක්වාත්, නැවතත් 2014 වසර අග භාගයේ සිට 2016 වසරේ අග භාගය දක්වාත් බලශක්ති හා ප්‍රවාහන අවධමන කාලපරිච්ඡේදවලට මුහුණ දී තිබුණ ද, එම අවධමන කාලපරිච්ඡේද තුළ වාර්තා වූ ඉහළ මූලික උද්ධමනය සහ නිතර මිල උච්චාවචනය වන ආහාර මිල උද්ධමනය හේතුවෙන්, එම කාලවලදී මතුපිට උද්ධමනය, සෘණ අගයක් වාර්තා නොකරන ලදී.

අ.2 රූප සටහන: මතුපිට උද්ධමනයට දායකත්වය
(කො.පා.මි.ද, 2006/07 =100, 2013=100 සහ 2021=100, වාර්ෂික ලක්ෂ්‍යමය)



සටහන: එක් එක් කාණ්ඩයේ මතුපිට උද්ධමනයට දායකත්වය, සලකා බැලෙන කාල සීමාවට අදාළ පදනම් වර්ෂය මත පදනම්ව ගණනය කර ඇත. දත්ත සම්බන්ධ කිරීමේ දී, නිරීක්ෂණ කිහිපයක් පවතින කාල සීමා සඳහා මෑත කාලීන පදනම් වර්ෂයට ප්‍රමුඛතාව ලබා දී ඇත.

මූලයන්: ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකු කාර්ය මණ්ඩල ගණනය කිරීම්

මතුපිට උද්ධමනය මෙන් නොව, මෑත කාලීනව වාර්තා වූ කැපී පෙනෙන ආර්ථික වර්ධන ප්‍රවණතා මගින් පෙන්නුම් කරන පරිදි, දේශීය ඉල්ලුම් තත්ත්ව යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් මූලික උද්ධමනය සෘණ මට්ටමකට පත් නොවිය. මූලික උද්ධමනයේ ඉහළ යෑම සඳහා, ලිහිල් මුදල් ප්‍රතිපත්ති සමඟ ආර්ථිකයේ සමස්ත ඉල්ලුම් තත්ත්ව වැඩි දියුණු වීම හේතු වී ඇති නමුත්, ඉහළ යෑම තවදුරටත් ක්‍රමික මට්ටමක පවතී. ඉහත සාධකවලට අමතරව, 2024 වසරේ මුල් භාගයේ දී එකතු කළ අගය මත බදු (VAT) නිසා මිල ගණන් ඉහළ යෑම සහ ඉහළ මට්ටමක පැවති ආහාර උද්ධමනය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය පදනම් බලපෑම ද 2025 වසර මුල් භාගයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය පහළ යෑමට හේතු විය.

මෙම සමුච්චිත බලපෑම් පිළිබිඹු කරමින්, 2025 වසරේ පෙබරවාරි මාසයේ දී අවධමනය 4.2%ක මට්ටමක් දක්වා වාර්තා වූ අතර, ඉන් අනතුරුව එම අවධමන ප්‍රවණතාව ක්‍රමයෙන් ලිහිල් වීම ආරම්භ විය. සමස්ත ඉල්ලුම් තත්ත්වය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමඟ මූලික උද්ධමනය ඉහළ යෑම, ඇතැම් මාසවල දී ආහාර මිල ගණන් ඉහළ යෑම සහ 2025 වසරේ ජූනි මැද භාගයේ දී විදුලි ගාස්තු ඉහළ දමමින් සිදු කළ සංශෝධන යන කරුණු සියල්ල ම අවධමන කාලපරිච්ඡේදය අවසන් වීම සඳහා දායක විය. මෙම තාවකාලික උද්ධමන කාලපරිච්ඡේදය ආර්ථික කටයුතුවල දිගු කාලීන පහත වැටීමකට හේතු වී නොමැති බව සැලකිය යුතු කරුණකි. මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වාර්තා වූ යහපත් වර්ධනය, අඩු විරැකියා අනුපාතිකයෙන් සහ ආර්ථික අර්බුදයෙන් පසු වාර්තා වූ අඩු මට්ටමට සාපේක්ෂව ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය ක්‍රමයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාව මගින් පෙන්නුම් කෙරෙන ශ්‍රම වෙළඳපොළ තත්ත්ව යථා තත්ත්වයට පත් වීම, පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ඉහළ යෑම, සහ ආනයන සැලකිය යුතු ලෙස ඉහළ යෑම මගින් එය පෙන්නුම් කෙරේ.

එහෙයින්, මෑත කාලීන අවධමන කාලපරිච්ඡේදය, ප්‍රධාන වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම සහ මිල පහත වැටීම නිසා ආර්ථික ක්‍රියාකාරකම් තවදුරටත් මන්දගාමී කරන අවධමන චක්‍රයක් හේතුවෙන් ඇති වූ තත්ත්වයක් ලෙස නොව, ආර්ථික අර්බුද සමයේ දී උච්චතම උද්ධමන අගය වාර්තා වීමෙන් පසුව මිල ගණන් සංශෝධනය වීමක් හරහා ඇති වූවක් ලෙස ද හැඳින්විය හැකිය.

ඉහළ ගිය මිල මට්ටම් සහ පාලනය වූ උද්ධමනය

අවධමන අවධියකින් පසුව මතුපිට උද්ධමනය නැවත ධන අගයකට පත්වීම මධ්‍යයේ වුව ද, මෑත කාලීන මාසවල දී උද්ධමනය ඉහළ යෑම සාපේක්ෂව මන්දගාමීව පැවතුණි (අ.3 රූප බලන්න). මෙම ප්‍රතිඵලය යම්තාක් දුරකට, 2022 වසරේ උද්ධමන කම්පනය අතරතුර නිරීක්ෂණය කළ කො.පා.මි.ද. පැසෙහි පිරිවැය පදනමේ සැලකිය යුතු ඉහළ යෑම පිළිබිඹු කරයි. මෙම කම්පනය ශ්‍රී ලංකා රුපියල ශීඝ්‍රයෙන් අවප්‍රමාණය වීම, සැපයුම් අංශයේ බාධා සහ දිගු කලක් තිස්සේ නොවෙනස්ව පැවති බලශක්ති මිලකරණයෙන් පසුව බලශක්ති මිල ගණන් ඉහළ දැමීමෙන් සිදුකරන ලද සංශෝධන සහ දිගු කලක් තිස්සේ පැවැති ලිහිල් මුදල් තත්ත්වවල පසු සම්ප්‍රේෂණ බලපෑම්වල ඒකාබද්ධ බලපෑමකි. එබැවින්, 2022 වසරේ දී නිරීක්ෂණය කළ බලශක්ති මිල සංශෝධන, දිගු කාලයක් පුරා අදාළ පිරිවැයේ යටිදැරි වර්ධනයන්ට ප්‍රතිචාර වශයෙන් මිල ගණන් නිවැරදි කිරීමක් ලෙස සැලකිය හැකිය. නිතර සිදුවන විදුලි ගාස්තු සංශෝධන සහ ඉන්ධන සහ LP ගෑස් සඳහා ක්‍රමානුකූලව සිදු කරනු ලබන මාසික මිල ගැළපුම් හේතුවෙන් වත්මන් බලශක්ති මිල ගණන් වෙනස්වීම් පිරිවැය පිළිබිඹු මිලකරණ රාමුවට අනුකූල වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වඩා ක්‍රමවත් සහ පුරෝකථනය කළ හැකි මිල වෙනස්වීම් ඇති වේ. ඒ අනුව, පවත්නා උද්ධමන වාතාවරණය සාපේක්ෂව ස්ථාවර, නමුත් ඉහළ ගිය මිල මට්ටම් හමුවේ ක්‍රියාත්මක වන බව හඳුනාගත හැකිය. එහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් සාමාන්‍ය ජනතාවගේ මිලදී ගැනුම් හැකියාවේ සුළු වැඩි වීමක් මධ්‍යයේ, විකුණුම් පරිමාවන් කෙරෙහි දැඩි බලපෑම් ඇතිවිය හැකි බැවින් ව්‍යාපාර විසින් මිල නියම කිරීමේ දී ප්‍රවේශම් සහගත ප්‍රවේශයක් අනුගමනය කළ හැකිය. තවද, අවධමනයට යම් වශයෙන් හේතු වූ, බලශක්ති සහ ප්‍රවාහන කාණ්ඩයයේ උද්ධමනය, පහළ අගයක සිට ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම අඛණ්ඩව ම සිදු වෙමින් පවතී. දිගු කාලයක් පුරා සිදු වන පිරිවැයේ වර්ධනයන්ට ප්‍රතිචාර වශයෙන් වරින් වර සිදුවන තියුණු වෙනස්කම් වෙනුවට අදියර වශයෙන් ක්‍රමික මිල වෙනස් කිරීම් සහ සංඛ්‍යානමය පදනම් බලපෑම් මෙම යථා තත්ත්වයට පත්වීමට ප්‍රධාන වශයෙන් බලපා ඇත. මෙම හැසිරීම් මතුපිට උද්ධමනය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමට දායක වී ඇත.

අ.3 රූප සටහන: පාරිභෝගික මිල දර්ශකයට එදිරිව මතුපිට උද්ධමනය (කො.පා.මි.ද., 2013=100 සහ 2021=100)



සටහන: 2022 වසර සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය කො.පා.මි.ද. (2013=100) මත පදනම් වේ

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රටවල් සමඟ සංසන්දනය

පිලිපීනය, ඉන්දුනීසියාව සහ පාකිස්ථානය වැනි කලාපීය ආර්ථිකයන් ඇතුළත්ව තෝරාගත් සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන් (අ.4 රූප සටහන) සමඟ සන්සන්දනය කිරීමේ දී, උද්ධමනය ඉහළ ම මට්ටමට ළඟා වූ පසු ඇති වන උද්ධමන හැසිරීමෙහි සමාන රටාවක් පෙන්නුම් කරයි. මෙම ආර්ථිකයන්ද ඔවුන්ගේ ඉතිහාසය තුළ ඉහළ උද්ධමන මට්ටම් වාර්තා කර ඇති අතර, ක්‍රමිකව සහ යම් අවස්ථාවලදී වේගවත්ව නිර්-උද්ධමන පථයක ගමන් කර, සාමාන්‍ය මට්ටමට ළඟා වී ඇත. මෙය සැලකිල්ලට ගත් කළ, මෙම රටවල් අතර අත්දැකීම් 2022 වසරේ උච්චතම උද්ධමන අවස්ථාවෙන් පසුව ශ්‍රී ලංකාවේ නිරීක්ෂණය කළ උද්ධමන මාර්ගයට බොහෝදුරට සමානතාවයක් පෙන්නුම් කරයි. ඉහළ උද්ධමන සහ මිල මට්ටම් වැඩිවීමකට ප්‍රතිචාර ලෙස ගනු ලැබූ දැඩි මුදල් ප්‍රතිපත්ති ප්‍රතිචාරවලින් පසුව, ආර්ථිකයන් ඉතා අඩු උද්ධමන අවධියකට ළඟා විය හැකි අතර, එය ස්ථායීතාවයට පත් වීමට පෙර කෙටි කාලයක් සඳහා සීමිත අවධමන අවධියකට පත්විය හැක. අ.4 රූප සටහනෙහි තුළින් එවැනි අඩු උද්ධමන කාලසීමා කෙටි කාලීන බව සහ පසුව උද්ධමනය පටු සහ අඩු උච්චාවචන පරාසයක් තුළ සාමාන්‍යකරණය විය හැකි බව පෙන්නුම් කෙරේ.

අ.4 රූප සටහන: උද්ධමනයේ උච්චතම අවස්ථා අත්විඳි කලාපීය ආර්ථිකයන් සමඟ උද්ධමන හැසිරීම සංසන්දනය (මාසික, වාර්ෂික ලක්ෂ්‍යමය)



*සටහන: උච්චතම උද්ධමන අගය වාර්තා කළ මාසය t කාල පරිච්ඡේදය ලෙස සලකන ලදී.

මූලයන්:ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, අන්තර්ජාතික පියවීම් බැංකුව, සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

නිගමනය

2022 වසරේ වාර්තාගත ඉහළම අගය වාර්තා වීමෙන් පසුව, සුදුසු මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහායයෙන් මතුපිට උද්ධමනය ක්‍රමයෙන් පහළ ගියේය. ප්‍රධාන වශයෙන් බලශක්ති සහ ප්‍රවාහන මිල ගණන්වල සිදුවූ පහළ යෑම් හේතුවෙන් කෙටි කාලීනව සෘණ අගයකට පත් වූ මතුපිට උද්ධමනය, ක්‍රමයෙන් අඩු ධන අගයන් කරා ඉහළ ගියේය. නිෂ්පාදන වියදම් ක්‍රමයෙන් ඉහළ යෑම හමුවේ වුව ද ආර්ථික අර්බුදයට පෙර, විදුලි සහ ඉන්ධන වැනි මිල ගණන්, වසර ගණනාවක් පුරා සංශෝධනය කර නොතිබුණි. 2022 වසරේ දී, නිෂ්පාදන වියදම් සැලකිය යුතු අන්දමින් ඉහළ යෑමත් සමඟ ව්‍යාපාර ඉහළ මිල ගණන් නියම කළ අතර, බලශක්ති සහ ප්‍රවාහන අංශවල පාලිත මිල ගණන් සංශෝධනය කරන ලදී. එයට අමතරව, මෙම මිල සංශෝධනවල සැලකිය යුතු වක්‍ර බලපෑම් සහිත විය. මේ සියලු සංශෝධන මිල පදනමේ ව්‍යුහාත්මක වෙනසකට හේතු විය හැකිය. මිල ගණන් ආර්ථික අර්බුදයට පෙර පැවති මට්ටමට වඩා ඉහළින් පවතින අතර බොහෝ ආර්ථිකයේ පාර්ශවකරුවන්ගේ මිලදී ගැනීමේ හැකියාව අඩු මට්ටමක පැවතීම හේතුවෙන්, ව්‍යාපාර පරික්ෂාකාරී මිල නිර්ණය කිරීමේ උපාය මාර්ග අනුගමනය කිරීමේ හැකියාවක් ඇත. මෙමගින් උද්ධමනය මෑත කාලීනව පහළ පථයක ගමන් කිරීමට හැකියවක් පවතී. පෙර නොවූ ආකාරයේ උද්ධමන ඉහළ යෑමට ප්‍රතිචාර ලෙස ක්‍රියාත්මක කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති තුළින්, අධික උද්ධමනයක් ඇති වීම වළක්වාලන ලද අතර මෙම ප්‍රතිපත්ති ඉක්මන් නිර්-උද්ධමනයකට දායක වන ලදී. මූලික උද්ධමනය මෙම කාලය පුරාම ධනාත්මකව පැවති අතර ක්‍රමානුකූල ඉහළ යෑමක් වාර්තා කළේය. තවද, වෙනත් බොහෝ ආර්ථික දර්ශකවලින් ද පෙන්නුම් කරන පරිදි ආර්ථිකයේ ඉහළ යන ඉල්ලුම් තත්ත්ව පිළිබඳ පැහැදිලි සලකුණු පවතී. මතුපිට උද්ධමනය ධන අගයකට පැමිණීමත් සමඟ මිල විචලනයන් වඩාත් මැනිය හැකි සහ පුරෝකථනය කළ හැකි තත්ත්වයට පත්ව ඇති අතර, මෙමගින්, ඉල්ලුම මත වන වක්‍රීය බලපෑම් සහිත දිගුකාලීන අවධමන අවදානම් මතුවීමට වඩා, වඩාත් ස්ථාවර මිල වාතාවරණයකට හුවමාරුවීමක් හඟවනු ලබයි. අවසාන වශයෙන්, පසුගිය අවධමනකාරී තත්ත්වය සහ උද්ධමනය ක්‍රමිකව ඉහළ යාම මධ්‍යයේ වුවද, උද්ධමනය ක්‍රමයෙන් 5% ඉලක්කය කරා ක්‍රමිකව ළඟාවනු ඇතැයි අපේක්ෂා කරන නමුත්, එසේ ළඟා වන වේගය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා මන්දගාමී විය හැකිය.

පවත්නා තොරතුරුවලට අනුව,[11] 2025 වසරේ දෙවන භාගය තුළ දී, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) සහ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) යන ද්විත්වය ම ඉහළ යෑමක් වාර්තා කළේය.

අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් වර්ධනය 2025 වසරේ පළමු භාගයේ දී අඛණ්ඩව ඉහළ ගිය අතර, මූර්ත වැටුප් වර්ධනය සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පැවතිය ද එහි ලිහිල් වීමක් ආරම්භ විය. 2025 වසරේ දෙවන භාගයේ දී, නාමික වැටුප් වර්ධනය තවදුරටත් ඉහළ ගොස් තෙවන කාර්තුවේ දී පමණ එහි උච්චතම මට්ටමට ළඟා වූ අතර, වසර අවසානයේ දී සුළු වශයෙන් මධ්‍යස්ථ මට්ටමකට පත් විය. එසේ වුවද, මූර්ත වැටුප් වර්ධනය 2025 වසරේ පළමු භාගයට සාපේක්ෂව 2025 වසරේ දෙවන භාගය පුරා අඛණ්ඩව පහත වැටුණු අතර, එය සැලකිය යුතු අන්දමින් අවම මට්ටම් දක්වා පහළ යමින් උද්ධමන තත්ත්වයේ සාමාන්‍යකරණය වීම පෙන්නුම් කළේය.

රාජ්‍ය අංශයේ වැටුප් 2025 වසරේ පළමු භාගයේ දී සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, වැටුප් සංශෝධන සහ හිඟ වැටුප් ගෙවීම් ඊට හේතු විය. ඒ හේතුවෙන්, නාමික සහ මූර්ත වැටුප් වර්ධනය යන ද්විත්වය ම 2025 වසර මුල් භාගයේ දී එහි උච්චතම අගය වාර්තා කළේය. 2025 වසරේ දෙවන භාගයේ දී, වැටුප් වර්ධනය මන්දගාමී වී ස්ථාවර වූ අතර නාමික වැටුප් වර්ධනය සමස්තයක් ලෙස නොවෙනස්ව අඩු මට්ටමක පැවතුණි. පෙර වසරේ දී සිදු කළ වැටුප් සංශෝධන සහ 2025 වසරේ පළමු භාගයේ දී බොහෝ දුරට ගෙවා අවසන් කළ හිඟ වැටුප් ගෙවීම්වල බලපෑම මෙන්ම පෙර පැවති අඩු උද්ධමන මට්ටම් 2025 වසරේ දෙවන භාගයේ දී සාමාන්‍ය තත්ත්වයට පත් වීම හේතුවෙන් මූර්ත වැටුප් වර්ධනය තවදුරටත් මන්දගාමී විය.

රූප සටහන 13*: අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2018=100) සහ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2016=100) වෙනස්වීම්*



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[11] මෙම කොටසේ දත්ත මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) සහ අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) මත පදනම් වේ.

3.2. මූර්ත අංශය

2025 වසරේ පළමු මාස නවය පුරාවටම ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් වර්ධන ප්‍රවණතාවක් පෙන්නුම් කරමින් 2025 වසරේ තෙවන කාර්තුව තුළ දී ශක්තිමත් ප්‍රසාරණයක් වාර්තා කළේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තුවලට අනුව, 2024 වසරේ අනුරූප කාල පරිච්ඡේදය තුළ වාර්තා වූ 4.9%ක ආර්ථික වර්ධනයට සාපේක්ෂව, ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2025 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වන පළමු මාස නවයේ දී 5.0%කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) වර්ධනය විය. තවද, 2025 වසරේ තෙවන කාර්තුවේ දී, ප්‍රධාන ආර්ථික අංශ ත්‍රිත්වයේ ම ධනාත්මක දායකත්වයක් ලබමින් ආර්ථිකය 5.4%ක වර්ධනයක් වාර්තා කළේය. කෘෂිකාර්මික අංශයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි, කටු පොල්), සත්ත්ව නිෂ්පාදන සහ එළවළු වගාව හේතු විය. කාර්මික අංශයේ කැපී පෙනෙන වර්ධනයන් සඳහා නිෂ්පාදන, ඉදිකිරීම්, සහ පතල් හා කැණීම් යන අනු අංශයන්හි වර්ධනයන් දායක විය. මේ අතර, සේවා අංශයේ වර්ධනය සඳහා මූල්‍ය සේවා, ප්‍රවාහන මෙන්ම තොග සහ සිල්ලර වෙළඳ කටයුතු යන අංශයන්හි වර්ධනයන් ප්‍රධාන වශයෙන් හේතු විය.

සංඛ්‍යා සටහන 01: මූර්ත ද.දේ.නි. වර්ධන ඇස්තමේන්තු (*වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත*, %) (*තාවකාලික*)

ආර්ථික කටයුතු	2024					2025			
	පළමු කාර්තුව	දෙවන කාර්තුව	තුන්වන කාර්තුව	සිව්වන කාර්තුව	වාර්ෂික	පළමු කාර්තුව	දෙවන කාර්තුව	තුන්වන කාර්තුව	පළමු මාස නවය
කෘෂිකර්මාන්තය	0.9	2.7	3.7	-2.2	**1.2**	-0.7	2.0	3.6	**1.6**
කර්මාන්ත	11.2	9.7	10.1	13.1	**11.0**	9.7	5.8	8.1	**8.0**
සේවා	2.5	1.9	2.6	2.5	**2.4**	2.8	3.9	3.5	**3.4**
ද.දේ.නි.	**5.1**	**4.1**	**5.3**	**5.4**	**5.0**	**4.8**	**4.9**	**5.4**	**5.0**

මූලය: ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2025 වසරේ සිව්වන කාර්තුව අවසානයේ දී දිට්වා සුළි කුණාටුවෙන් ඇති වූ බාධා මධ්‍යයේ වුව ද මෙම කාර්තුව සඳහා වන ආර්ථික දර්ශක ආර්ථිකයේ ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කළේය. පෙර කාර්තුවල දී දක්නට ලැබුණු අඛණ්ඩ වර්ධන ප්‍රවණතාවට අනුකූලව, 2025 වසරේ අවසාන භාගයේ දී කාර්මික නිෂ්පාදන දර්ශකය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනයක් වාර්තා කළේය. ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරමින් සේවා, නිෂ්පාදන සහ ඉදිකිරීම් සඳහා වන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක, 2025 වසරේ දෙවන භාගයේ දී වර්ධනයන් වාර්තා කළේය.[12] කෙසේ වුව ද, අයහපත් කාලගුණික තත්ත්වයෙන් එල්ල වූ බාධා පිළිබිඹු කරමින් 2025 වසරේ සිව්වන කාර්තුවේ දී කෘෂිකාර්මික කටයුතු මිශ්‍ර ප්‍රතිඵල ලබාදෙනු ඇතැයි අපේක්ෂා කෙරෙයි.

[12] නවතම දත්ත අනුව, සේවා සහ නිෂ්පාදන සඳහා වන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී, පිළිවෙළින්, 67.9ක් සහ 60.9ක් දක්වා වර්ධනය වූ අතර ඉදිකිරීම් අංශයේ සමස්ත කටයුතු දර්ශකය 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී 67.1ක් ලෙස සටහන් විය. මේ අතර, කාර්මික නිෂ්පාදන දර්ශකය 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී 99.0ක් ලෙස වාර්තා විය.

රූප සටහන 14: ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සහ කාර්මික නිෂ්පාදන දර්ශකයේ වෙනස් වීම්



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ස්ථාවර මිල ගණන් යටතේ වියදම් ප්‍රවේශය ගත් කළ, 2025 වසරේ තෙවන කාර්තුවේ දී දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සඳහා පරිභෝජන වියදම් හේතු වූ අතර, එය අවසන් පෞද්ගලික පරිභෝජන වියදමේ දක්නට ලැබුණු කැපී පෙනෙන වර්ධනය හේතුවෙන් ඇති වූවක් විය. කෙසේ වුව ද, දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ආර්ථික වර්ධනය සඳහා ධනාත්මක දායකත්වයක් ලබා දුන්න ද, තොග වට්නාකම් වෙනස්වීම සහ වටිනා දේ අත්පත් කර

සංඛ්‍යා සටහන 02: සමස්ත ඉල්ලුම (තාවකාලික)

අයිතමය	ස්ථාවර මිල අනුව (2015)							
	2024 තෙවන කාර්තුව		2024 පළමු මාස නවය		2025 තෙවන කාර්තුව		2025 පළමු මාස නවය	
	රු. බි.	වාර්ෂික ලක්ෂ්‍යමය %	රු. බි.	වාර්ෂික ලක්ෂ්‍යමය %	රු. බි.	වාර්ෂික ලක්ෂ්‍යමය %	රු. බි.	වාර්ෂික ලක්ෂ්‍යමය %
දේශීය ඉල්ලුම	3,189	9.7	9,218	6.4	3,391	6.3	9,807	6.4
පරිභෝජනය	2,611	4.1	6,979	0.7	2,821	8.0	7,518	7.7
ආයෝජනය (දළ ප්‍රාග්ධන සම්පාදනය)	577	44.4	2,240	29.3	570	(1.3)	2,289	2.2
ශුද්ධ විදේශීය ඉල්ලුම	(35)	(139.9)	4	(97.0)	(65)	(88.0)	(121)	(3,189.7)
+ භාණ්ඩ හා සේවා අපනයනය	795	9.0	2,272	11.9	827	4.0	2,406	5.9
- භාණ්ඩ හා සේවා ආනයනය	830	29.0	2,268	19.5	892	7.5	2,528	11.4
ද.දේ.නි.	**3,154**	**5.3**	**9,222**	**4.9**	**3,326**	**5.4**	**9,686**	**5.0**

මූලය: ජනලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ගැනීම් සහ අතහැරීම පහත වැටීම හේතුවෙන් 2025 වසරේ තෙවන කාර්තුවේ දී දළ ප්‍රාග්ධන සම්පාදනය සුළු වශයෙන් සංකෝචනය විය. තව ද, 2025 වසරේ තෙවන කාර්තුවේ දී ශුද්ධ විදේශීය ඉල්ලුම සංකෝචනය වූ අතර, ස්ථාවර මිල ගණන් යටතේ, භාණ්ඩ හා සේවා අපනයන වර්ධනයට වඩා ආනයන වර්ධනය ඉහළ යෑම එයට හේතු විය.

3.3. මුදල් අංශය

පොලී අනුපාතික

මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව 2025 වසරේ දී සමස්ත වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහය සමස්තයක් ලෙස පහළ ගිය අතර, 2025 වසරේ අවසාන භාගයේ දී කෙටි කාලීන පොලී අනුපාතිකවල දක්නට ලැබුණු විෂමතා 2026 වසරේ මුල් කාලයේ දී යථා තත්ත්වයට පත්ව ඇත.

2025 වසරේ මැයි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25කින් අඩු කිරීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය තවදුරටත් පහළ ගොස් ජූලි මාසයේ අග භාගය වන තෙක් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ආසන්නයේ රැඳි පැවතුණි. කෙසේ වුව ද, ඉන් අනතුරුව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ක්‍රමයෙන් ඉහළ යෑම ආරම්භ වූ අතර, දේශීය මුදල් වෙළඳපොළ තුළ සහභාගීත්ව ආයතන අතර පැවති ද්‍රවශීලතාව බෙදී යාමේ අසමානතාව මේ සඳහා හේතු විය. ඒ අනුව, 2025 වසරේ අවසානය වන විට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පදනම් අංක 30ක පමණ අපගමනයක් වාර්තා කරමින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට වඩා ඉහළ අගයක පැවතුණි. ආනයන සහ පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය අඛණ්ඩව වර්ධනය වන තත්ත්වයක් තුළ අතිරේක ද්‍රවශීලතාවක් පද්ධතිය වෙත සැපයීමේ අවශ්‍යතාවක් නොවූ හෙයින් බරිත සාමාන්‍ය එක්ෂණ මුදල් අනුපාතිකයට එක්දින ප්‍රතිපත්ති අනුපාතිකයෙන් අපගමනයවීම සඳහා මහ බැංකුව විසින් ඉඩ ලබා දෙන ලදී. සමස්ත වෙළඳපොළ ද්‍රවශීලතාව වර්ධනය වීම සහ ද්‍රවශීලතාව බෙදී යාමේ විෂමතා කිසියම් දුරකට ලිහිල් වීමත් සමඟ, 2026 වසරේ ජනවාරි 27 වන දින වනවිට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2025 වසර අවසානයේ දී වාර්තා වූ මට්ටමේ සිට පදනම් අංක 30කින් පමණ පහළ යෑමක් වාර්තා කරමින් 2026 වසරේ ජනවාරි අග භාගයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට වඩා පහළ ගියේය.

බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ හැසිරීමට අනුකූලව, බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකය ද 2025 වසරේ අග භාගයේ දී ඉහළ ගිය අතර, එය 2026 වසරේ මුල් කාලයේ දී පහළ ගියේය.

අඩු මට්ටම්වල ස්ථාවරව පැවති බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය 2025 වසර අග භාගයේ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඇතුළු කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම සහ තැන්පතු පොලී අනුපාතිකවල ඉහළ යෑම එමගින් පිළිබිඹු කෙරිණි. ඒ අනුව, 2025 වසරේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා වූ කාලයේ දී මාසික බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය පදනම් අංක 85කින් පමණ ඉහළ ගියේය. කෙසේ වුව ද, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය පහළ යෑමට අනුකූලව 2026 වසරේ මුල් කාලයේ දී, සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකයේ පහළ යෑමක් වාර්තා විය.

රූප සටහන 15: එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ සහ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ හැසිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2025 වසරේ දී අනෙකුත් වෙළඳපොළ ණය සහ තැන්පතු පොලී අනුපාතික සමස්තයක් ලෙස අඩු වුව ද, කෙටි කාලීන පොලී අනුපාතික සහ භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතිකයන්හි දක්නට ලැබුණු පීඩනය මෙන්ම ඇතැම් බැංකු මුහුණ දුන් ද්‍රවශීලතා ගැටලු කිසියම් දුරකට පිළිබිඹු කරමින් 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතිකවල යම් වැඩි වීමක් දක්නට ලැබුණේය.

රූප සටහන 16: තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල වෙනස්වීම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අඩු උද්ධමන පරිසරය සහ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හේතුවෙන් 2025 වසර තුළ ප්‍රාථමික වෙන්දේසිවල සියලුම කල්පිරීම්වලට අදාළ භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික පදනම් අංක 50-90කින් පහත වැටුණි. කෙටි කාලීන බිල්පත් ඵලදා අනුපාතිකවල පමණ ඉක්මවා වාර්තා වූ පහළ යෑම කිසියම් දුරකට නිවැරදි කරමින් ජූලි මස මැද භාගයේ දී ඵලදා අනුපාතික ඉහළ යෑමේ පීඩනයක් යම් වශයෙන් දක්නට ලැබුණ ද 2025 වසරේ වැඩි කාලයක් පුරා ඵලදා අනුපාතික සාපේක්ෂ වශයෙන් ස්ථායී මට්ටමක පැවතුණි. කෙසේ වුව ද, දිට්වා සුළි කුණාටුවෙන් පසු ප්‍රතිසංස්කරණ කටයුතු වෙනුවෙන් රජයේ ණය ගැනීම් ඉහළ යා හැකි බවට වෙළඳපොළ තුළ පැවති අපේක්ෂා හේතුවෙන් 2025 වසරේ දෙසැම්බර් අග භාගයේ දී ඵලදා අනුපාතික කැපී පෙනෙන අයුරින් ඉහළ යෑමක් වාර්තා කළේය. එනමුත් මෑතකාලීන වෙන්දේසිවල දී භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතිකවල යම් පහළ යෑමක් පෙන්නුම් කළ අතර, දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන වෙළඳපොළ ඉල්ලුම ස්ථායීව පැවතුණි. වරින් වර මෙවැනි විචලනයන් සිදු වුව ද, ද්විතියික වෙළඳපොළ සමස්ත ඵලදා අනුපාතික වක්‍රය 2024 වසර අවසානයේ වාර්තා වූ මට්ටම්වලට වඩා පහළ මට්ටමක පවතී.

මේ අතර, 2025 වසරේ අගෝස්තු මාසයේ දී උද්ධමනය ධන අගයකට පත් වීමෙන් අනතුරුව අඛණ්ඩව ඉහළ යෑමත් සමඟ මෑත කාලීනව මූර්ත පොලී අනුපාතිකවල පහත වැටීමක් දක්නට ලැබුණි. ඉදිරියේ දී, උද්ධමනය අපේක්ෂිත පරිදි ඉලක්කගත මට්ටමට ළඟා වීමත් සමඟ මූර්ත පොලී අනුපාතික තවදුරටත් ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

රූප සටහන 17: මූර්ත පොලී අනුපාතික



සටහන: නාමික පොලී අනුපාතිකය සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම් වූ) ගැළපීමෙන් මාසික මූර්ත පොලී අනුපාතිකය ගණනය කර ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය

***2025* වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව යම් විචලනයක් පෙන්නුම් කළ ද සමස්තයක් ලෙස එය අඛණ්ඩව අතිරික්ත මට්ටමක පැවතුණි.**

2025 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ සාමාන්‍ය ද්‍රවශීලතාව රුපියල් බිලියන 136ක මට්ටමක පැවතුණි. 2025 වසර තුළ පැවති මෙම අතිරික්ත ද්‍රවශීලතාව සඳහා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය ශුද්ධ පදනමින් මිල දී ගැනීම මෙන්ම මහ බැංකුව හා බලපත්‍රලාභී වාණිජ බැංකු අතර සිදුකළ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, රජය සිය විදේශ ණය සේවාකරණ ගෙවීම් සඳහා අවශ්‍ය විදේශ විනිමය මහ බැංකුවෙන් ලබා ගැනීමට සිය රුපියල් ද්‍රවශීලතාව භාවිත කිරීම සහ ව්‍යවහාර මුදල් ආපසු ලබා ගැනීම මෙන්ම මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අදාළ කූපන් ලැබීම්, 2025 වසර තුළ දී ද්‍රවශීලතාවෙහි සිදුවූ පහළ යෑම් සඳහා හේතු විය. මහ බැංකුව ශුද්ධ පදනමින් විදේශ විනිමය මිලදී ගැනීම හේතුවෙන්, 2026 ජනවාරි 27 වැනි දින වන විට, දේශීය මුදල් වෙළඳපොළ සාමාන්‍ය ද්‍රවශීලතා අතිරික්තය රුපියල් බිලියන 165ක් පමණ දක්වා ඉහළ ගියේය.

මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් පිළිබඳව සැලකීමේ දී, ඒක්ෂණ වෙළඳපොළ සහ ප්‍රතිමිලදී ගැනුම් වෙළඳපොළ යන ද්විත්වය ම සක්‍රියව පැවති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් ගනුදෙනු පරිමාවන්හි අඛණ්ඩ වර්ධනයක් දක්නට ලැබුණි.

රූප සටහන 18: එක්දින මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාවය, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් අනුපාතිකයෙහි හැසිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම

පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි සැලකිය යුතු ලෙස වැඩිවීම සහ බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම හේතුවෙන් 2025 වසර තුළ දී පුළුල් මුදල් සැපයුම *(M_{2b})* අඛණ්ඩ ප්‍රසාරණය විය.

2025 වසර තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය රුපියල් ට්‍රිලියන 2.1ක පමණ ප්‍රමාණයකින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණයෙහි වාර්ෂික

ලක්ෂ්‍යාමය වර්ධනය, 2024 වසරේ වාර්තා වූ 10.7%ට සාපේක්ෂව 2025 වසරේ දී 25.2%ක් විය. 2025 වසරේ ජූනි මාසයේ සිට පෞද්ගලික අංශයට ණය ලබා දීමේ කැපී පෙනෙන ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර, 2025 වසරේ දෙසැම්බර් මාසයේ හැර, අඛණ්ඩව මාස හයක් පුරා මාසික ණය ප්‍රසාරණය රුපියල් බිලියන 200 ඉක්මවා ගියේය. 2025 වසරේ දී පෞද්ගලික අංශයේ ණය ප්‍රසාරණය වීම සඳහා ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම මෙන්ම 2025 වසරේ මුල් භාගයේ දී වාහන ආනයන සීමා ලිහිල් කිරීමෙන් පසුව වාහන ආනයනවලට අදාළ මූල්‍යනය සඳහා වූ ඉහළ ඉල්ලුම ද ප්‍රධාන වශයෙන් හේතු විය. තව ද, රාජ්‍ය අංශයේ ණය මන්දගාමී වීම පෞද්ගලික අංශයේ ණය ප්‍රසාරණය සඳහා අවකාශය නිර්මාණය කළේය.මේ අතර, 2025 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය සාපේක්ෂ වශයෙන් ආර්ථිකයේ සියලුම අංශ කරා ව්‍යාප්තව පැවතුණි. පෞද්ගලික අංශ වෙත ලබා දුන් ණය අංශ අනුව වර්ගීකරණය කිරීමේ දී, 2025 වසරේ මේ දක්වා කාලය තුළ එහි ඉහළ ම ප්‍රතිශතය සේවා අංශය වෙත ලබාදුන් ණය වන අතර, ඉන් අනතුරුව ඉහළ ණය ප්‍රමාණයක් යොමු වී ඇත්තේ කර්මාන්ත අංශය වෙතයි. එමෙන් ම පෞද්ගලික ණය සහ අත්තිකාරම් ද සැලකිය යුතු මට්ටමක පවතී. තව ද, 2025 වසරේ අවසානයේ දී මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය ප්‍රමාණය 49.3%ක වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනයක් සටහන් කරමින් රුපියල් බිලියන 789ක සමස්ත ප්‍රසාරණයක් 2025 වසරේ දී වාර්තා කළ අතර, ප්‍රධාන වශයෙන් වාහන ආනයනය සඳහා වූ ඉහළ මූල්‍යනය එමගින් පිළිබිඹු කරයි. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වුවද, 2025 වසරේ තුන් වන කාර්තුව තුළ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශය සඳහා ලබාදුන් ණය 29.8%ක් වූ අතර, එය ආර්ථික අර්බුදයට පෙර පැවති මට්ටමට සාපේක්ෂව අඩු මට්ටමක පවතී.

රූප සටහන 19: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය අංශ අනුව



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 20: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් අංශ වශයෙන් පෞද්ගලික අංශයට ලබාදුන් ණය



2025 වසර තුළ බැංකු පද්ධතිය මගින් රජයට ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් බිලියන 15ක සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. මෙම කාලපරිච්ඡේදයේ දී මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය ඉහළ යෑම සඳහා පූර්ණ වශයෙන් හේතු වූයේ බැඳුම්කර ඵලදා අනුපාතික පහළ යෑම මධ්‍යයේ මහ බැංකුව සතු රජයේ සුරැකුම්පත්වල වෙළඳපොළ තක්සේරු වටිනාකම ඉහළ යෑමය. 2025 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ප්‍රමාණය සමස්ත වශයෙන් රුපියල් බිලියන 39ක සමස්ත සංකෝචනයක් වාර්තා කළ අතර, ස්වාරක්ෂක රැස් කිරීම සඳහා වන රජයේ ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය බැංකුවල පවතින රජයේ තැන්පතු ඉහළ යෑම මෙමගින් පිළිබිඹු කෙරුණි.

මාර්ග සංවර්ධන අධිකාරිය, ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා පොහොර සංස්ථාව ඇතුළු රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යාපාර විසින් සිදු කරන ලද ශුද්ධ ණය ආපසු ගෙවීම්, 2025 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය සතු වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය රුපියල් බිලියන 137කින් පමණ කැපී පෙනෙන ලෙස සංකෝචනය වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

විදේශීය අංශයේ දක්නට ලැබුණු කාර්යසාධනයේ සිදු වූ වැඩි දියුණු වීම පිළිබිඹු කරමින්, 2025 වසරේ දී බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් අඛණ්ඩව වැඩි දියුණු විය. සමස්ත ප්‍රසාරණයට දායක වෙමින්, මහ බැංකුව සතු ශුද්ධ විදේශීය වත්කම් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මේ සඳහා නිල සංචිත ශක්තිමත් කර ගැනීම සඳහා මහ බැංකුව විසින් සිදු කරන ලද විදේශ විනිමය මිලදී ගැනීම් බොහෝ දුරට සහාය විය. 2025 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම්වල සුළු ඉහළ යෑමක් පමණක් වාර්තා විය.

මෙම ප්‍රවණතාවන්ට අනුකූලව, පුළුල් මුදල් සැපයුමෙහි (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2024 වසර අවසානයේ වාර්තා වූ 8.6% සිට 2025 වසරේ අවසානය වන විට 11.5%ක් දක්වා ඉහළ ගියේය.

රූප සටහන 21: පුළුල් මුදල් සැපයුමේ (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා දායකත්වය



සටහන: 2025 වසරේ දී මහ බැංකුවේ සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අනෙකුත් අයිතමයන්හි (ශුද්ධ) සෘණ වටිනාකම ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් රඳවාගත් ඉපැයුම් සහ සංචිත හේතු විය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

3.4. විදේශීය අංශය

වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වීම මධ්‍යයේ වුව ද, 2025 වසරේ දී ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කර ඇති බවට ඇස්තමේන්තු කර ඇති අතර, එය මෙතෙක් වාර්තා වූ ඉහළ ම වාර්ෂික අතිරික්තය වේ. 2025 වසරේ දී ණය සේවාකරණ ගෙවීම් මධ්‍යයේ වුව ද දළ නිල සංචිත ඉහළ ගිය අතර මහ බැංකුව ශුද්ධ පදනමින් විදේශ විනිමය මිලදී ගැනීම සහ බහු පාර්ශ්වීය සංවිධානවලින් වූ ලැබීම් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, අඛණ්ඩව වසර දෙකක දී අතිප්‍රමාණ වීමක් වාර්තා කිරීමෙන් අනතුරුව එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි 5.6%ක අවප්‍රමාණය වීමක් වාර්තා විය.

ගෙවුම් තුලනය

2025 වසරේ දී විදේශීය අංශයේ ජංගම ගිණුම එ.ජ. ඩොලර් බිලියන 1.7ක අතිරික්තයක් වාර්තා කර ඇතැයි තාවකාලිකව ඇස්තමේන්තු ගත කර ඇත. සේවා සහ ද්විතියික ආදායම් ගිණුම්වල ශක්තිමත් ක්‍රියාකාරීත්වය සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩුවීම මේ සඳහා හේතු විය. වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය 2024 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් බිලියන 6.1ක සිට 2025 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 7.9ක් දක්වා පුළුල් විය. 2024 වසරට සාපේක්ෂව 2025 වසරේ දී 6.3%ක අපනයන ආදායම් වර්ධනය අභිබවා යමින් ආනයන වියදම 14.0%කින් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙතෙක් වාර්තා වූ ඉහළම අගය වාර්තා කරමින් සහ 2022 වසරේ වාර්තා වූ මීට පෙර පැවැති ඉහළම අගය වූ එ.ජ. ඩොලර් බිලියන 13.1ක අපනයන ආදායම ඉක්මවා යමින්, 2025 වසරේ අපනයන ආදායම එ.ජ. ඩොලර් බිලියන 13.6ක් ලෙස සටහන් විය. මේ අතර, එ.ජ. ඩොලර් බිලියන 22.2ක් වන ඉහළම ආනයන වියදම් අගය 2018 වසරේ දී වාර්තා කිරීමෙන් පසුව, 2025 වසරේ දී වාහන ආනයනය ඉහළ යෑම හේතු කරගෙන ආනයන වියදම එ.ජ. ඩොලර් බිලියන 21.5ක් ලෙස

වාර්තා විය. 2025 වසරේ ජනවාරි මාසයේ දී වාහන ආනයන සීමා ලිහිල් කිරීමෙන් පසුව 2025 වසරේ අප්‍රේල් මාසයේ සිට වාහන ආනයනය කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. ඒ අනුව, පෞද්ගලික සහ වාණිජ කටයුතු සඳහා යොදාගන්නා වාහන ආනයනය ඇතුළුව වාහන ආනයන වියදම 2025 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 2.0ක් දක්වා විශාල වශයෙන් වර්ධනය වූ අතර, එමගින් ආනයන වියදම් මත වන පීඩනය ඉහළ යමින් වෙළඳ හිඟය පුළුල් විය.

රූප සටහන 22: වෙළඳ ගිණුම



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

රූප සටහන 23: **පෞද්ගලික රථවාහන සහ වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා වාහන ආනයන සංයුතිය**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉතිහාසයේ වාර්තා වූ ඉහළම සංචාරක පැමිණීම් සංඛ්‍යාව 2025 වසරේ දී වාර්තා වුව ද, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම සහ මෙරට ගත කරන සාමාන්‍ය කාලය

පිළිබඳ ඇස්තමේන්තු අඩු කරමින් සංශෝධනය කිරීම හේතුවෙන් 2025 වසරේ සංචාරක ඉපැයීම් 2024 වසරට සාපේක්ෂව 1.6%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් බිලියන 3.2ක් බවට ඇස්තමේන්තු කර ඇත. තවද, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ[13] 2024 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.6ක අගයට සාපේක්ෂව 22.8%ක (වාර්ෂික ලක්ෂ්‍යමය) වර්ධන ප්‍රවණතාවක් වාර්තා කරමින් 2025 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 8.1ක් දක්වා ඉහළ ගියේය.

රූප සටහන 24: සංචාරක කර්මාන්තය සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ

සංචාරක පැමිණීම් සහ සංචාරක ඉපැයීම්*

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**



*2025 වසරේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම සහ මෙරට ගත කරන සාමාන්‍ය කාලය පිළිබඳ ඇස්තමේන්තු අඩු කරමින් සංශෝධනය කර ඇත.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලට දිරිවා සුළි කුණාටුවෙන් පසුව ලැබුණු ප්‍රේෂණ වැනි වෙනත් ප්‍රේෂණ ඇතුළත් විය හැකිය.

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
බලපත්‍රලාභී බැංකු

රූප සටහන 25: විදේශීය ජංගම ගිණුම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[13] විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ තුළ දිට්වා සුළි කුණාටුවෙන් පසුව ලද ප්‍රේෂණ වැනි අනෙකුත් ප්‍රේෂණ ද ඇතුළත් විය හැකිය.

විදේශීය ජංගම ගිණුමේ හිතකර වර්ධන ප්‍රවණතා පැවතිය ද මූල්‍ය ගිණුමේ කාර්යසාධනය මන්දගාමීව පැවතුණි. සෘජු ආයෝජන ව්‍යවසාය වෙත සම්බන්ධයක් නොමැති පාර්ශ්වවලින් ලැබුණු විදේශීය ණය ඇතුළු විදේශීය සෘජු ආයෝජන, 2024 වසරේ අනුරූප කාලයේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 589ට සාපේක්ෂව, 2025 වසරේ සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවයක කාලයේ දී එ.ජ. ඩොලර් මිලියන 891ක් ලෙස වාර්තා විය. මේ අතර, 2025 වසරේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 248ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර, ප්‍රාථමික සහ ද්විතීයික වෙළඳපොළ ගනුදෙනු ඇතුළුව කොළඹ කොටස් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 122ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.

රූප සටහන 26: මූල්‍ය ගිණුම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

විනිමය අනුපාතිකය

2025 වසර අග භාගයේ දී ශ්‍රී ලංකා රුපියලේ යම් අවප්‍රමාණය වීමක් වාර්තා වූ අතර ඒ සඳහා ආනයන ඉල්ලුම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, 2025 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල 5.6%කින් අවප්‍රමාණය විය. 2026 වසර ආරම්භයේ සිට පළමු මුදල් ප්‍රතිපත්ති නිවේදනය දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව 0.1%ක සුළු අතිප්‍රමාණය වීමක් වාර්තා කරමින් සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතුණි. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2025 වසර තුළ දී ශ්‍රී ලංකා රුපියල යුරෝ, ස්ටර්ලින් පවුම්, චීන යුවාන්, ජපන් යෙන්, ඉන්දියානු රුපියල් සහ ඕස්ට්‍රේලියානු ඩොලරය වැනි අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අවප්‍රමාණය විය. තව ද, 2025 වසරේ දී, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමට අනුකූලව නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) යන දර්ශක ද්විත්වය ම පහළ ගියේය.

රූප සටහන 27: විනිමය අනුපාතිකයේ හැසිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංචිත වත්කම්

රජයේ සහ මහ බැංකුවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් අඛණ්ඩව සිදු කිරීම මධ්‍යයේ වුවද, දළ නිල සංචිත[14] 2024 වසර අවසානයේ පැවති එ.ජ.ඩොලර් බිලියන 6.1 සිට 2025 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.8ක් දක්වා ඉහළ ගියේය. 2025 වසර තුළ දී සංචිත ගොඩනඟා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් සහාය වූයේ මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් සිදු කළ එ.ජ. ඩොලර් බිලියන 2ක් පමණ වන ශුද්ධ විදේශ

රූප සටහන 28: මාසික දළ නිල සංචිත, සංචිත ප්‍රමාණාත්මකභාවය සහ ශුද්ධ මිලදී ගැනීම්



** වටිනාකම නිර්ණය වන දිනය මත පදනම් වී ඇත.*

සටහන: චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම දළ නිල සංචිතවලට ඇතුළත් වන අතර, එය භාවිත කිරීම යම් කොන්දේසිවලට යටත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[14] චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වන අතර, එය භාවිත කිරීම යම් කොන්දේසිවලට යටත් වේ.

විනිමය මිල දී ගැනීම්ය (වටිනාකම නිර්ණය වන දිනය මත පදනම්ව). ප්‍රධාන වශයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ ලැබීම් ඇතුළුව බහු පාර්ශ්වීය ආයතනවල ලැබීම් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) විසින් විස්තීර්ණ ණය පහසුකම යටතේ ලබා දුන් වාරික දෙක සහ කඩිනම් මූල්‍යන උපකරණය යටතේ ලබා දුන් මූල්‍යන පහසුකම ද දළ නිල සංචිත ඉහළ නංවා ගැනීමට උපකාරී විය.

3.5. රාජ්‍ය මූල්‍ය අංශය

අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන් 2025 වසරේ පළමු මාස එකොළහ තුළ දී රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය තවදුරටත් ශක්තිමත් විය.

2025 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී රජයේ ආදායම් සහ ප්‍රදාන නාමික වශයෙන් 35.4%ක වාර්ෂික වර්ධනයක් වාර්තා කර ඇත. පෙර වසරට සාපේක්ෂව 36.8%කින් ඉහළ ගොස් අනුරූප කාලපරිච්ඡේදය තුළ දී රුපියල් බිලියන 4,611.5ක් දක්වා ළඟා වූ බදු ආදායම් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. නිෂ්පාදන /සුරා බදු, එකතු කළ අගය මත බද්ද, ආදායම් බදු, ආනයන බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද යන බදුවලින් එකතු වූ බදු ආදායම් වැඩි වීම, මෙම කැපී පෙනෙන ඉහළ යෑමට දායක විය. ප්‍රධාන වශයෙන් වාහන ආනයනය ආශ්‍රිත බදු හේතුවෙන්, මෙම කාල සීමාව තුළ දී, රජය සිය බදු ආදායම් ඉලක්කයෙන් 98%ක් පමණ සපුරා ගැනීමට සමත් විය. 2025 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වන මාස එකොළහක කාලපරිච්ඡේදය තුළ දී බදු නොවන ආදායම්, 2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 19.2%කින් ඉහළ ගියේය. මේ අතර, 2025 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 8.3%කින් වර්ධනය විය. මෙම වැඩි වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ, සහනාධාර සහ සංක්‍රාම ගෙවීම්, වැටුප් සහ වේතන ගෙවීම් සහ පොලී ගෙවීම් සඳහා වන වියදම් ඉහළ යෑමයි. තවද, 2025 වසර ආරම්භයේ දී යම් අඩු වීමක් වාර්තා කළ ද, 2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2025 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ප්‍රාග්ධන වියදම් 6.6%කින් ඉහළ ගියේය.

රාජ්‍ය මූල්‍ය අංශයේ මෙම ධනාත්මක වර්ධන ප්‍රවණතා සමඟ 2025 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් තුනෙහි ම, නාමික වශයෙන් සහ පුරෝකථනය කළ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වර්ධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2025 වසරේ ජනවාරි සිට නොවැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී සමස්ත අයවැය හිඟය අඩු වූ අතර ප්‍රාථමික ශේෂය, 2024 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රුපියල් බිලියන 927.8ට සාපේක්ෂව රුපියල් බිලියන 1,941.8ක් දක්වා ඉහළ ගොස් කැපී පෙනෙන අතිරික්තයක් වාර්තා කළේය.

රූප සටහන 29: ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්



මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් බලපෑමට ලක් වූ ජන ජීවිත යථා තත්ත්වයට පත් කිරීමේ සහ හානියට පත් වූ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමේ අභියෝගයට රාජ්‍ය මූල්‍ය අංශයට මුහුණ පෑමට සිදු විය. මේ සඳහා, සුළි කුණාටුව හේතුවෙන් විනාශයට පත් ව ඇති යටිතල පහසුකම් නැවත ගොඩනැඟීමේ කටයුතුවලට සමගාමීව, රජය විසින් විවිධ සහන ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාවට නංවා ඇත. ඒ අනුව, ප්‍රාථමික ශේෂයේ අපේක්ෂිත වඩා යහපත් කාර්යසාධනය මගින් 2025 වසර තුළ දී ආපදා සහන ක්‍රියාමාර්ග සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සැලසීමේ අවකාශය නිර්මාණය කර ඇත. තවද, 2026 වසරේ අයවැය සඳහා පාර්ලිමේන්තුව රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කළේය. මෙම අමතර මූල්‍යනය පවතින මුදල් ස්වාරක්ෂක භාවිතයෙන් සපුරා ගනු ලබන අතර, 2026 වසරේ අයවැය මගින් ප්‍රකාශයට පත් කළ පරිදි, 2026 වසර සඳහා වන ණය සීමාව රුපියල් බිලියන 3,740ක් ලෙස නොවෙනස්ව පවතිනු ඇත.

3.6. මූල්‍ය අංශය

හිතකර සාර්ව ආර්ථික තත්ත්ව හේතුකොටගෙන, කාර්යසාධනයේ වර්ධනයක් සමඟින් මූල්‍ය අංශය ශක්තිමත්ව පැවතුණි.

මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව 2025 වසර තුළ දී අඛණ්ඩව වර්ධනය විය. ප්‍රධාන වශයෙන්, ණය සහ ලැබීම්වල සැලකිය යුතු ඉහළ යෑම හේතුවෙන්, බැංකු අංශයේ මුළු වත්කම්, 2025 වසර තුළ දී ප්‍රසාරණය විය. ඒ අනුව, 2025 වසර අවසානයේ දී මුළු වත්කම් 12.6% ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, එහි වටිනාකම රුපියල් ට්‍රිලියන 24.9ක් විය. තවද, මුදල් ප්‍රතිපත්තියේ ලිහිල් වීම මධ්‍යයේ, දළ ණය සහ ලැබීම් සැලකිය යුතු ලෙස 21.5%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් පෙන්නුම් කරමින්, 2025 වසර අවසානයේ දී රුපියල් ට්‍රිලියන 13.9ක් දක්වා ළඟා විය.

අදියර 3 ණය අනුපාතය තුළින් පිළිබිඹු වන බැංකු අංශයේ සමස්ත ණය පැහැර හැරීමේ අවදානම, 2024 වසරේ වාර්තා වූ 12.3%ක අගයට සාපේක්ෂව, 2025 වසර අවසානයේ දී 9.4%ක් දක්වා අඩු විය. වසර තුළ බදු පසු ලාභය

13.8%ක වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනයක් පෙන්නුම් කරමින්, 2024 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 324.2ට සාපේක්ෂව, 2025 වසරේ දී රුපියල් බිලියන 369.1ක බදු පසු ලාභයක් බැංකු අංශය වාර්තා කළේය. කෙසේ වෙතත්, හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය, වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ ශුද්ධ පොලී ආන්තිකය යන ලාභදායීත්ව දර්ශක 2024 වසරේ අවසානයට සාපේක්ෂව, 2025 වසර අවසානයේ දී සුළු වශයෙන් පහළ ගියේය.

අදාළ කාල පරිච්ඡේදය තුළ සිදු වූ සැලකිය යුතු ණය ප්‍රසාරණයත් සමඟ, ද්‍රවශීලතා ආවරණ අනුපාතය මගින් මනිනු ලබන බැංකු අංශයේ ද්‍රවශීලතාව, පෙර වසරේ අවසානයට සාපේක්ෂව, 2025 වසර අවසානයේ දී පහළ ගියේය. ඒ අනුව, රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2024 වසර අවසානයේ වාර්තා වූ 349.9%ට සාපේක්ෂව, 2025 වසර අවසානයේ දී 283.9% දක්වා පහළ ගිය අතර, සියලු මුදල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය 2024 වසර අවසානයේ වාර්තා වූ 313.8%ට සාපේක්ෂව, 2025 වසර අවසානයේ දී 249.7%ක් දක්වා පහළ ගියේය. කෙසේ වුවද, බැංකු අංශයේ ද්‍රවශීලතා ආවරණ අනුපාත අවම අවශ්‍යතා මට්ටම වන 100%ට වඩා සැලකිය යුතු ඉහළ අගයක පැවතුණි. මේ අතර, බැංකු අංශයේ සමස්ත ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය අවසානයේ වාර්තා වූ 18.5%ට සාපේක්ෂව, 2025 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට 18.7% දක්වා වර්ධනය වූ අතර, අවදානම් මත බර තැබූ වත්කම් වර්ධනයට සාපේක්ෂව සමස්ත නියාමන ප්‍රාග්ධන වර්ධනය ඉහළ මට්ටමක පැවතීම එයට හේතු විය. ඒ අනුව, 2025 වසරේ සැප්තැම්බර් මාසය අවසානය වන විට අවදානම් මත බර තැබූ වත්කම්වල වාර්තා වූ 17.6%ක වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනයට සාපේක්ෂව, නියාමන ප්‍රාග්ධනය 19.2%ක වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනයක් වාර්තා කළේය.

ප්‍රධාන වශයෙන් ණය සහ අත්තිකාරම්වල ඉහළ යෑම හේතුවෙන් 2025 වසර අවසානයේ දී මුදල් සමාගම් අංශයේ වත්කම් 44.0%ක වාර්ෂික ලක්ෂ්‍යාමය ප්‍රසාරණයක් වාර්තා කළේය. ඒ අනුව, වාහන ණය සහ රන් ණය ඉහළ යෑම හේතුවෙන් මෙම අංශයේ දළ ණය සහ අත්තිකාරම් 2025 වසර අවසානයේ දී සැලකිය යුතු ලෙස 51.9%ක වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනයක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඇපකර මත පදනම් වූ ණය කෙරෙහි ඉහළ නැඹුරුවක් පෙන්නුම් කරමින්, මෙම අංශයේ ණය කළඹ, වාහන සහ රන් මත ලබා දුන් ණය වෙත විශාල වශයෙන් සංකේන්ද්‍රණය වී පැවතුණි. ණයවල ගුණාත්මකභාවයේ වර්ධනයක් පෙන්නුම් කරමින් මෙම අංශයේ දළ අදියර 3 ණය අනුපාතය, 2024 වසර අවසානයේ දී වාර්තා වූ 11.5%ට සාපේක්ෂව, 2025 වසර අවසානය වන විට 6.1%ක් දක්වා පහළ ගියේය. මෙම අංශයේ ද්‍රවශීලතා තත්ත්වය 2025 වසර අවසානය වන විට රුපියල් බිලියන 74.3ක ද්‍රවශීලතා අතිරික්තයක් වාර්තා කරමින් නියාමන අවශ්‍යතාව අභිබවා පැවතුණි. තවද, 2025/26 මුදල් වර්ෂයේ පළමු මාස නවය සඳහා 45.0%ක වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනයක් පෙන්නුම් කරමින්, 2025 අප්‍රේල් - දෙසැම්බර් කාලය සඳහා මෙම අංශයේ බදු පසු ලාභය රුපියල් බිලියන 61.5ක් විය. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව සම්බන්ධයෙන් ගත් කල, 2025 වසර අවසානය වන විට මුදල් සමාගම් අංශය 18.7%ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් වාර්තා කළේය.

සංඛ්‍යා සටහන 03: බැංකු සහ මුදල් සමාගම් අංශවල මූල්‍ය ශක්තිමත්භාවය පිළිබඳ ප්‍රධාන දර්ශක

ප්‍රධාන දර්ශක (%)	2024 වසර අවසානයේ දී	2025 වසර අවසානයේ දී (තාවකාලික)
බැංකු අංශය		
දළ අදියර 3 ණය අනුපාතය	12.3	9.4
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය	2.6	2.5
හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය	17.4	16.6
ශුද්ධ පොලී ආන්තිකය	4.4	4.3
සමස්ත ප්‍රාග්ධන අනුපාතය	20.3	17.9
මුදල් සමාගම් අංශය		
දළ අදියර 3 ණය අනුපාතය	11.5	6.1
වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය	5.8	6.3
හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය	12.8	16.2
ශුද්ධ පොලී ආන්තිකය	10.9	10.6
සමස්ත ප්‍රාග්ධන අනුපාතය	21.3	18.7

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කොටස් වෙළඳපොළ සලකා බැලීමේ දී, කොළඹ කොටස් හුවමාරුවේ සියලු කොටස් මිල දර්ශකය (ASPI) සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 (S&P SL20) දර්ශකය, 2024 වසරේ දී වාර්තා කළ 49.7%ක් සහ 58.5%ක වර්ධනයන්ට සාපේක්ෂව, 2025 වසර අවසානය වන විට, පිළිවෙළින්, 41.9%ක සහ 26.6%ක වර්ධනයක් වාර්තා කරමින් කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කළේය. කොටස් වෙළඳපොළෙහි ඉහළ යෑමේ ප්‍රවණතාවට දේශීය ආයෝජකයන්ගේ සහභාගීත්වය ප්‍රධාන වශයෙන් හේතු විය. ශක්තිමත් වාර්ෂික කාර්යසාධනයක් පැවතිය ද නොවැම්බර් 12 වෙනිදා සිට වසර අවසානය වන කාලය තුළ දී සියලු කොටස් මිල දර්ශකය සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය, පිළිවෙළින්, 4.4%ක් සහ 6.1%ක් වශයෙන් සුළු වශයෙන් පහළ ගියේය. කෙසේ වුවද, 2026 වසරේ ආරම්භයේ දී වෙළෙඳපොළෙහි වර්ධන ප්‍රවණතාව නැවත ඇති වූ අතර, 2026 වසර ආරම්භයේ සිට ජනවාරි 27 වන විට, සියලු කොටස් මිල දර්ශකය සහ එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශක, පිළිවෙළින්, 5.9%ක සහ 8.4%ක වර්ධනයන් වාර්තා කර ඇත.

2024 වසර තුළ දී සමාගම් 10ක් විසින් සාංගමික ණයකර ඔස්සේ 12.00% සිට 15.25%ක පොලී අනුපාතික සහිතව රැස් කළ රුපියල් බිලියන 94.8ට සාපේක්ෂව, 2025 වසර තුළ දී, කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම් 21ක් සාංගමික ණයකර ඔස්සේ 9.75% සිට 13.15%ක පොලී අනුපාතික පරාසයක් තුළ රුපියල් බිලියන 133.2ක් රැස් කර ඇත. කෙසේ වුවද, 2025 වසර තුළ, කොළඹ කොටස් හුවමාරුවේ ද්විතීයික වෙළඳපොළ තුළ එ.ජ. ඩොලර් මිලියන 127.7ක සමස්ත ශුද්ධ විදේශීය ගලා යෑමක් වාර්තා විය.

3.7. ගෝලීය ප්‍රවණතා

ප්‍රතිපත්තිමය සහ භූ දේශපාලනික වශයෙන් ඇති වන අස්ථාවරත්වයන් හමුවේ වුව ද, තාක්ෂණික දියුණුව සහ ප්‍රතිපත්ති උත්තේජක හේතුකොට ගෙන, ආර්ථික වර්ධනයේ ඉහළ ඔරොත්තු දීමේ හැකියාවක් ඇති බව ගෝලීය ආර්ථික පුරෝකථන මගින් සංඥා කෙරේ. ඉල්ලුම අඩු වීම සහ බලශක්ති මිල ගණන් තවදුරටත් පහළ යෑම හමුවේ, ගෝලීය උද්ධමනය තවදුරටත් ලිහිල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දීර්ඝ කාලයක් පුරා පැවති ලිහිල් ගෝලීය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයෙන් අනතුරුව, අභියෝගාත්මක ආර්ථික තත්ත්ව මධ්‍යයේ, ගෝලීය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් ස්ථාවරයක සිට වඩාත් ප්‍රවේශම්කාරී ස්ථාවරයකට මෑතක දී විතැන් වී ඇත.

2026 වසරේ දී, ගෝලීය ආර්ථික වර්ධනය නැඟී එන වෙළඳපොළ සහ දියුණු වෙමින් පවතින ආර්ථික මත ප්‍රධාන වශයෙන් රඳා පවතිනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එම ආර්ථික 4.0%කින් ද, දියුණු ආර්ථික 1.8%කින් ද වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත.[15] සැපයුම් දාම සහ වෙළඳ භාණ්ඩ මිල ගණන්වලට බලපෑමක් ඇති කළ හැකි වෙළඳ අවිනිශ්චිතතා සහ භූ දේශපාලනික අවිනිශ්චිතතා හේතුවෙන් ඉදිරි කාලයේ දී වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා පහළ යෑමට නැඹුරුතාවක් පෙන්නුම් කරයි. තවද, දිගු කාලීන පොලී අනුපාතික මත පීඩනයක් ඇති කළ හැකි සහ ඒ හරහා පොදුවේ මූල්‍ය තත්ත්වයන් මත පීඩනයක් ඇති කළ හැකි විශාල රාජ්‍ය මූල්‍ය හිඟයන් සහ ඉහළ ගිය රාජ්‍ය ණය ද ඉදිරි ආර්ථික වර්ධනය අපේක්ෂිත මට්ටමට වඩා පහළ යෑමට හේතුවන අවදානම් ලෙස පවතී. ඉල්ලුම අඩු වීමේ සහ බලශක්ති මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතා නොවෙනස්ව පැවතීම හේතුවෙන්, බොහෝ දුරට ගෝලීය උද්ධමන පුරෝකථන මීන් පෙර පැවති පුරෝකථනවලට සාපේක්ෂව නොවෙනස්ව පවතී.[16]

රූප සටහන 30: ගෝලීය ආර්ථික ප්‍රතිපත්ති අවිනිශ්චිතතා දර්ශකය



මූලය: fred.stlouisfed.org

[15] 2026 වසරේ ජනවාරි 19 වන දින නිකුත් කරන ලද ජා.මූ. අරමුදලෙහි ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook, ජනවාරි 2026) පිළිබඳ නවතම යාවත්කාලීන කිරීමට අනුව, ගෝලීය වර්ධනය 2026 දී 3.3% ක් සහ 2027 දී 3.2% ක් ලෙස ශක්තිමත් ව පවතිනු ඇති බව පුරෝකථනය කර ඇති අතර, එය 2025 වසරේ ඔක්තෝබර් මාසයේ ලෝක ආර්ථික ඉදිරි දැක්මට වඩා තරමක් ඉහළට සංශෝධනය කර ඇත.

[16] ගෝලීය උද්ධමනය 2026 දී 3.8% ක් සහ 2027 දී 3.4% ක් ලෙස පුරෝකථනය කර ඇති අතර, එය 2025 වසරේ ඔක්තෝබර් මාසයේ ලෝක ආර්ථික ඉදිරි දැක්ම වාර්තාවේ පුරෝකථන වලින් නොවෙනස්ව පවතී.

ලෝක ප්‍රතිපත්ති අවිනිශ්චිතතා දර්ශකය,[17] මගින් පෙන්නුම් කරන පරිදි, ගෝලීය ප්‍රතිපත්ති අවිනිශ්චිතතාව, මෑතක දී යම් අඩු වීමක් පෙන්නුම් කළ ද, තවමත් ඉහළ මට්ටමක පවතී. මේ අතර, භූ දේශපාලනික ගැටලු, ආරක්ෂණවාදය කෙරෙහි නැඹුරු වෙමින් වෙළෙඳ ප්‍රතිපත්තිවල සිදු වූ විශාල පරිවර්තන සහ ආර්ථික ජාතිකවාදයේ පිබිදීම හේතුවෙන් වූ වෙළඳ අවිනිශ්චිතතා පෙන්නුම් කරමින් ලෝක වෙළඳ අවිනිශ්චිතතා දර්ශකය ද[18] ඉහළ මට්ටමක පවතී.

ගෝලීය ආර්ථික අවිනිශ්චිතතාවය ඉහළ යෑම හමුවේ වඩාත් ප්‍රවේශම්කාරී ප්‍රතිපත්ති කෙරෙහි වන නැඹුරුව පිළිබිඹු කරමින්, ගෝලීය මුදල් ප්‍රතිපත්තිය වඩාත් මධ්‍යස්ථ හෝ ප්‍රවේශම් සහගත ස්ථාවරයක් ගෙන ඇත. 2025 වසරේ දී අඛණ්ඩව සිව් වතාවක දී පොලී අනුපාතික අඩු කිරීමෙන් පසුව, යුරෝපීය මහ බැංකුව 2025 වසරේ ජූනි මාසයේ සිට එහි ප්‍රධාන පොලී අනුපාතික ත්‍රිත්වය නොවෙනස්ව පවත්වා ගෙන ගියේය. 2025 වසරේ ඔක්තෝබර් මස සිදු කළ පොලී අනුපාතික අඩු කිරීමෙන් පසු, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව 2025 වසර තුළ සිදු කළ තෙවන පොලී අනුපාතික අඩු කිරීම සනිටුහන් කරමින්, 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී තවදුරටත් සිය මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පහළ දැමුවේය. එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් මෙම ප්‍රතිපත්ති තීරණය සඳහා සලකා බලන ලද සාධක ලෙස ආර්ථික ක්‍රියාකාරකම්වල දුර්වල වීම, රැකියා ලබා ගැනීම් මන්දගාමී වීම, විරැකියා අනුපාතය ඉහළ යාම සහ උද්ධමනය ඉහළ යාම සඳහන් කර ඇති අතර, ආර්ථික ඉදිරි දැක්ම වටා පවතින අවිනිශ්චිතතාව ඉහළ මට්ටමක තිබෙන බව ද සටහන් කර ඇත. 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී, පහළ ගිය උද්ධමනය හමුවේ මන්දගාමී ආර්ථික වර්ධනය හේතු වශයෙන් දක්වමින්, එංගලන්ත මහ බැංකුව සිය බැංකු අනුපාතිකය පහළ දැමුවේය. 2025 වසරේ දෙසැම්බර් මස තුළ දැඩි මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කළ එකම මහ බැංකුව වූ ජපාන මහ බැංකුව, අවිනිශ්චිත වෙළඳ ප්‍රතිපත්ති සහ උද්ධමනය සුළු වශයෙන් ඉහළ යෑම යන කරුණු මගින් සිය ප්‍රතිපත්ති තීරණය

රූප සටහන 31: ගෝලීය ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම්



සටහන: 2026 වසරේ ජනවාරි මස *27* වන දිනට පවතින දත්ත මත පදනම් වේ.

මූලය: https://www.cbrates.co

[17] https://fred.stlouisfed.org/series/GEPUCURRENT

[18] https://worlduncertaintyindex.com/data/

සාධාරණීකරණය කළේය. චීන මහජන බැංකුව විසින් ආර්ථිකය තුළ මන්දගාමීත්වයක් පැවතිය ද සුළු වශයෙන් ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් අනුගමනය කරමින් සිය පදනම් ණය අනුපාතික නොවෙනස්ව පවත්වා ගෙන ගියේය. මේ අතර, ඉන්දියානු සංචිත බැංකුව, ඉන්දියාව පෙන්නුම් කළ ශක්තිමත් වර්ධනය සහ අඩු උද්ධමනය හේතුකොට ගෙන, 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී ප්‍රති මිල දී ගැනුම් අනුපාතිකය අඩු කිරීමට තීරණය කළේය. මෙම පදනම් පොලී අනුපාතික අඩු කිරීමත් සමඟ ඉන්දියානු සංචිත බැංකුව ඉදිරියේ දී මධ්‍යස්ථ ප්‍රතිපත්ති ස්ථාවරයක් අඛණ්ඩව අනුගමනය කරනු ඇති බවට නිවේදනය කළේය.

ගෝලීය ආහාර සහ බලශක්ති මිල ගණන් 2025 වසරේ දී වාර්තා වූ මට්ටම්වලට සාපේක්ෂව වර්තමානයේ දී පහළ මට්ටමක පවතී. කෙසේ වුවත්, 2025 වසරේ දී සැපයුම් අංශයෙහි ඇති වූ ගැටලුකාරී තත්ත්වයන් හේතුවෙන් ගෝලීය තෙල් මිල ගණන්වල වරින් වර යම් විචලනයන් දක්නට ලැබුණි. කෙසේ වුවද, වෙනිසියුලාවේ සහ ඉරානයේ භූ දේශපාලනික අර්බුද ඉහළ යෑම හමුවේ හටගත් සැපයුම් අවිනිශ්චිතතා හේතුවෙන්, 2026 වසරේ ජනවාරි මාසයේ දී මෙම මිල ගණන්වල ඉහළ යෑමේ පීඩනයක් ඇති විය. ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ ආහාර මිල ගණන් දර්ශකය 2024 වසර අවසානයේ දී වාර්තා කළ 127.3ක සිට 2025 වසරේ අගෝස්තු මාසයේ 130.0ක් කරා ළඟා වීමෙන් පසු, 2025 වසරේ දෙසැම්බර් මාසයේ දී 124.3ක් දක්වා පහළ ගියේය. හිතකර සැපයුම් තත්ත්වයන් සමඟ කිරි නිෂ්පාදන, සීනි සහ ධාන්‍ය වර්ගවල මිල දර්ශකයන් පහළ යෑම මීට ප්‍රධාන වශයෙන් හේතු විය.

***රූප සටහන 32:* ගෝලීය බලශක්ති මිල ගණන් සහ ආහාර මිල ගණන් වල හැසිරීම**



මූලය: ආහාර හා කෘෂිකර්ම සංවිධානය

මූලය: fred.stlouisfed.org

ISBN 978-624-6764-21-0